# වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය

# කාර්යසාධන වාර්තාව 2016

19, චෛත්‍ය පාර, කොළඹ 01
දුරකථන: 011-2439352, 011-2435161
වෙබ්:www.portmin.gov.lk

# පෙරවදන

නාවික ප්‍රවාහනය, ජාතික ඒකාබද්ධතාවය ඇතිකිරීමට මෙන්ම රටක ආර්ථිකය කෙරෙහි සහ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරන, ගෝලීය ආර්ථික වර්ධනයට දායකත්වය ලබා දෙන ප්‍රධානතම අංගයක් ලෙස හඳුන්වාදිය හැකිය. වරායයන්, සාගරයෙන් මායිම් වන රටවල්හි වැදගත් ආර්ථික ක්‍රියාකාරකම් නියෝජනය කරන අතරම ආර්ථිකයට සහ රටට විවිධ මට්ටමින් ප්‍රතිලාභ ලබා දීමට දායකත්වය සපයනු ලැබේ.

ශ්‍රී ලංකාව, දකුණු ආසියාව සහ අග්නිදිග ආසියාව අතර භෞතික හා ආර්ථික සම්බන්ධතාවය වැඩි දියුණු කල හැකි දූපත් රාජ්‍යයක් ලෙස සැලකේ. දකුණු ආසියාවේ ප්‍රධාන නැව් භාණ්ඩ අන්තර් හුවමාරු කේන්ද්‍රස්ථානයක් ලෙස සලකන ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වරාය වන කොළඹ වරාය, කලාපය තුල මෙන්ම කලාපයෙන් පිටත වෙළඳ සහ ආයෝජන ප්‍රවර්ධනය සඳහා යොදා ගනුලබේ.

කොළඹ වරාය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වරාය වශයෙන්, රටේ සමාජීය ආර්ථික වර්ධනයට විශාල මෙහෙයක් ඉටු කරන අතර, ත්‍රිකුණාමලය, ගාල්ල, කන්කසන්තුරේ, මයිලිඩ්ඩි, පේදුරු තුඩුව, කරෙයිනගර් සහ හම්බන්තොට යන අනෙකුත් වරායයන් මගින්ද සාගරය සහ ගොඩබිම අතර ආර්ථික ක්‍රියාකාරකම් සිදු කිරීම, භාණ්ඩ ප්‍රවාහනය, සංචාරක ප්‍රවර්ධනය ඇති කිරීම සහ රැකියා අවස්ථා ලබාදීම මගින් සමාජ සත්කාරයක්ද සිදු කරනු ලැබේ.

2016 වසර තුලදී වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට පහත සඳහන් ඉලක්ක ජය ගැනීමට හැකිවිය.

- 2016 ජූනි 06 වන දින ගැඹුරු ජල තටාකාංගනයක් සහිත කොළඹ වරායේ දෙවන පර්යන්තය වන නැගෙනහිර පර්යන්තය පුළුල් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යෝජනා සඳහා වන ඉල්ලීම් (EOI) කැඳවීම සඳහා දැන්වීම් පලකරන ලදී. මෙම යෝජනාවන් ඇගයීම ආසියානු සංවර්ධන බැංකුවේ සහය සහිතව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කරනු ලබයි.
- හම්බන්තොට සහ ත්‍රිකුණාමලය යන වරායයන් ආශ්‍රිතව පවතින භූගෝලීය පිහිටීම උපයෝගී කර ගනිමින් මුහුදු ආහාර සැකසුම්, ස්වභාවික වායුන් යොදාගනිමින් බලශක්ති උත්පාදනය, ගැඹුරු මුහුදේ ඉන්ධන සැපයීම, ඉන්ධන සැපයීමේ මෙහෙයුම්, නැව් අලුත්වැඩියා කිරීම සහ නැව් නිෂ්පාදනය ආදී කර්මාන්ත මෙන්ම පිරිසැකසුම් කර්මාන්ත වන සිමෙන්ති, ඉලෙක්ට්‍රොනික් උපකරණ, පොහොර, ඛනිජ තෙල් ආශ්‍රිත කර්මාන්ත ආදී තවත් බොහෝ කර්මාන්ත දේශීය සහ විදේශීය ආයෝජකයන්ගේ සහය ඇතිව ඇති කිරීම සහ ඒ තුලින් ශ්‍රී ලාංකික තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථා උත්පාදනයට යෝජනා ඉදිරිපත්කර ඇත.
- 2016 වර්ෂය තුලදී හම්බන්තොට වරාය සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි වශයන් රුපියල් මිලියන 892.5 ක් පවුල් 366ක් සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලබා දෙන ලදී.
- යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇති ගාලු කොටුව පරිශ්‍රයේ සහ ජෛව විවිධත්වයකින් යුතු විශේෂ පරිසර පද්ධතියක් ලෙස සැලකෙන රූමස්සල ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තය (Eco Tourism) ඉහළ නැංවීම සඳහා, උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් යෝජනා සඳහා වන ඉල්ලීම (EOI) කැඳවීමට සැලසුම් කර ඇත. මගී ප්‍රවාහන නෞකා සඳහා වන පහසුකම් සහ විනෝදාස්වාද පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා යෝජනා සඳහා වන ඉල්ලීම් (EOI) කැඳවීමටද කටයුතු කර ඇත.

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ වරායයන්හි වර්තමාන තත්ත්වය සහ දෛනික මෙහෙයුම් සංකීර්ණත්වය හේතුවෙන් නව මෙහෙයුම් හා කළමනාකරණ පද්ධතියක් හදුන්වාදීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. මෙම නව පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් මෙහෙයුම් ජාලයේ හා නාවික හා ගොඩබිම් ප්‍රවාහනයේදී ඇතිවන ගැටළු නිරාකරණය කර ගැනීමට මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය තුලින් සේවාලාභී අවශ්‍යතා වඩා සාර්ථකව මෙහෙයවීමටද හැකියාව ලබා දිය හැක.

මෙම නව මෙහෙයුම් හා කළමනාකරණ පද්ධතිය යටතේ, E-වරාය සංකල්පය හඳුන්වාදීම තුලින් තොරතුරු තාක්ෂණය මත පදනම් වන භාණ්ඩ ප්‍රවාහන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම තීරණාත්මක පියවරක් වනු ඇත. වර්තමාන මෙහෙයුම් ක්‍රමවේදය තොරතුරු තාක්‍ෂණය සහ පරිඝනකගත කළමනාකරණ ක්‍රමවේද වලින් සමන්විත ත වන පරිදි ප්‍රතිසංවිධානය කිරීම තුලින් වරායේ බහලුම් මෙහෙයුම් හැසිරවීමේ ක්‍රමවේදය කාර්යක්‍ෂම කල හැක. මෙමගින් අනෙකුත් පාර්ශවකරුවන්ට කාලීන දත්ත සඳහා ප්‍රවේශ වීමට අවස්ථාව සැලසෙන බැවින් දෙපාර්ශවය අතර අන්තර් සහ සම්බන්ධතාවයද වර්ධනය වේ. භාණ්ඩ ප්‍රවාහනයට අදාල තොරතුරු හුවමාරුව සඳහා තාක්ෂණික සහය ලැබීම තුලින් “වැඩ කිරීමේ ක්‍රමවේදය” වෙනස් වීමටද හේතු වනු ඇත.

වරාය හා නාවික ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය, පුද්ගලික අංශයේ දායකත්වය සහිතව රාජ්‍ය සහ පුද්ගලික හවුල්කාරිත්වය යටතේ හෝ ඒකාබද්ධ ව්‍යාපෘති ලෙස සිදු කිරීමට යෝජනා වී ඇත. මේ යටතේ නැගෙනහිර බහාලුම් පර්යන්තය සහ හම්බන්තොට වරාය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත. රාජ්‍ය සහ පුද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය තුලින් රජයට හෝ ආයතනයට මූල්‍යමය අර්බුදයකට මුහුණ දීමට සිදු නොවන බැවින් වරාය ක්ෂේත්‍රයේ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන සහ මෙහෙයුම් සඳහා මෙම ක්‍රමවේදය අනුව ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු වී ඇත.

මෙම අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන ලංකා නැව් සංස්ථාවට 2016 වසරේදී “සිලෝන් ප්‍රින්සස්” සහ “සිලෝන් බ්‍රීස්" යන නෞකා දෙක මිලදී ගැනීමට හැකි විය. එම නාවික යාත්‍රා වල මංගල ගමන් වාර චීනයේ වෙිහායි නැව් තටාංගනයේ සිට 2016 ජනවාරි 30 සහ 2016 ජූනි 23 වැනි දිනයන්හිදී ආරම්භ කරන ලදී. මෙම නැව්, තොග භාණ්ඩ ප්‍රවාහනයට මෙන්ම ආධුනික නාවිකයන් පුහුණු කිරීම සඳහා යෝග්‍ය වන ආකාරයට සැලසුම් කර ඇත. 2016 වසර තුලදී රාජ්‍ය හා පුද්ගලික අංශයේ නාවික අධ්‍යාපන ආයතන වලින් න්‍යායාත්මක දැනුම ලබාගත් ආධුනික නාවිකයන් 52 දෙනෙකු සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීමට මේ අනුව හැකි වී ඇත.

අමාත්‍යාංශය යටතේ පවතින තවත් ආයතනයක් වන වෙළඳ නාවික ලේකම් කාර්යාලය නාවික කටයුතු වලට අමතරව නාවිකයන්ගේ ආරක්ෂාව, පිළිගැනීම සහ නාවික කටයුතු පිලිබඳ ජාත්‍යන්තර නීති සහ අනපනත් සම්බන්ධ ජාත්‍යන්තර නාවික සංවිධානයේ අනිවාර්ය විගණනයට 2016 වසරේදී සාර්ථකව මුහුණ දෙන ලදී.

එමෙන්ම ISO 9001: 2008 තත්ත්ව කළමනාකරණ සහතිකය යාවත්කාලීන කිරීමට ද හැකිවිය. ඊට අමතරව ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත නාවිකයන්ගේ අඛණ්ඩ මුදාහැරීමේ සහතික සහ (CDC) සහ ප්‍රවීණතා සහතික (COC) ජීවමිතික තොරතුරු ඇතුලත් වන පරිදි වඩා ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික ක්‍රමවේදයක් භාවිතා කරමින් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

මීට අමතරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව වරාය හා නාවික ක්ෂේත්‍රයන්හි සියලු පාර්ශ්වකරුවන් ගේ සම්බන්ධීකරණය ලබා ගැනීම සඳහා උපදේශක සභාව සහ අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණ කමිටුව ස්ථාපිත කිරීමට අමාත්‍යාංශයට හැකි විය. මෙම කමිටු දෙක, දැනට පවත්නා ප්‍රතිපත්ති සැකසීමේ සහ සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියට සහ අමාත්‍යාංශයේ විෂය පථයට අදාල වන ව්‍යාපෘති හඳුනාගැනීමට දායකත්වය ලබා දෙයි.

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ 2016 වර්ෂය සඳහා වන මෙම ප්‍රගති වාර්තාව රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/ 27 මගින් දෙන ලද උපදෙස් වලට අනුකූලව පිළියෙල කර ඇත.

## I වන කොටස


අමාත්‍යාංශයේ පොදු තොරතුරු, සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කර ඇත.

## II වන කොටස

අමාත්‍යාංශයේ විෂය පථයට නතුවන ආයතන වන,

- වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය
- ලංකා නැව් සංස්ථාව

2016 වසර තුල ළඟාකරගත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කෙරේ.



## ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

### ඉදිරි දශකය වංචාව දූෂණය නැතිකර අභියෝග ජයගන්නා වසරයි........

2016 වසරෙහි කාර්යසාධන වාර්තාවට පණිවුඩයක් තබනුයේ ගෙවීගිය වසරේදී වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය ලැබූ ප්‍රගතිය ගැන වූ අවංක සතුටිනි. මෙම වසර මා වරාය සහ නාවික අමාත්‍ය ධූරයෙහි කටයුතු කරන දෙවන වසරයි. පළමු වසරේදී වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල, විශේෂයෙන්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වංචා, දූෂණ හා නාස්තිය අවම කිරීමට පියවර ගතිමු. මේ වසරේදී අපගේ මූලික අරමුණ වූයේ එකී ආයතනවල ප්‍රශ්ණ හා ගැටුම්කාරී තත්ත්වයන්ට කෙටි, මධ්‍ය හා දිගුකාලීන විසඳුම් ලබාදීමයි.

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය යටතේ ප්‍රධාන රාජ්‍ය ව්‍යාවසායක ආයතන දෙකක් වේ. ඒ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ලංකා නැව් සංස්ථාවයි. මෙයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත ණය ප්‍රමාණය 2016 වර්ෂය ආරම්භයේදී රු. බිලියන 233ක් විය. එම ණය ප්‍රමාණයෙන් 67%ක් ම වූයේ හම්බන්තොට වරාය සඳහා ඉහල පොලියට ලබාගත් ණයයි. සිලෝන් බ්‍රීස් සහ සිලෝන් ප්‍රින්සස් නෞකා මිලදී ගැනීමට ලංකා නැව් සංස්ථාව වූ ණය මුදල ඇමරිකානු ඩොලර් මිලියන 80 කි. කෙසේ නමුත් අපගේ ස්වාධීන නිරීක්ෂණය වූයේ එම නෞකාවලට ගෙවූ මුදල සාධාරණීකරණය කළ නොහැකි බවයි. වර්ෂ ආරම්භයේදීම අප මුහුණ දුන් ප්‍රධානතම අභියෝගය වූයේද ව්‍යාපාරික සැලැස්මක් හෝ ශක්‍යතා වාර්තාවක් නොමැතිව එලෙස ලබාගත් අධික ණය බර හමුවේ ආයතනය නොවැටී පවත්වාගෙන යාම වේ. වසර අවසානයේ ආපසු හැරී බලන විට ඒ මහා අභියෝගය බොහෝ දුරට කළමනාකරණය කිරීමට හැකිවූ බවද මම අවංකව ප්‍රකාශ කරමි. වඩාත් වැදගත් වන්නේ මහා ණය බරක් පැවතියද රැකියා සුරක්ෂිතතාවය හා ආයතන සුරක්ෂිතතාවය සමබර කර ගැනීමට ගෙවීගිය වසරේදී වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය ලබාදුන් මගපෙන්වීමයි. නමුත් අප හමුවේ ඇති අභියෝග අවසන් නොමැති බවද මම අවධාරණය කරමි.

එළැඹෙන වසරේදී අප අමාත්‍යාංශයේ අරමුණ වන්නේ නිශ්චිත ජයග්‍රාහී ඉලක්කයක් කරා එක් එක් ආයතන නිවැරදිව යොමු කිරීම වේ. එහිදී ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධානතම බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියට පැවරුණු ඉලක්කයයි. මෙරට නෞකා ආශ්‍රිත වෙළඳාමේදී වැඩි කොටසක් හිමිකර ගැනීම ලංකා නැව් සංස්ථාවේ ඉලක්කය වේ. වෙරළාසන්න මගී ප්‍රවාහන සේවය විධිමත් කිරීම සහ තරගකාරී කාර්යක්ෂම වරාය, නාවික සහ සමුද්‍රීය වෙළඳපොලක් නිර්මාණය කිරීම වෙළඳ නාවික ලේකම් කාර්යාලයට පැවරුණු කාර්යයකි. එම සියලු කාර්යයන් සහ ඉලක්ක සපුරාගනිමින් නූතන ජාත්‍යන්තර වෙළඳාමෙහි පෙර අපර දිග යා කරන වරාය, නාවික සහ සමුද්‍රීය මධ්‍යස්ථානයක් බවට පත් කිරීම අප අමාත්‍යාංශයේ මූලික දැක්ම වේ.

අද අප මේ ගෙවමින් සිටින්නේ ජනපති - අගමැති ප්‍රමුඛ සම්මුතිවාදී යහපාලන ආණ්ඩුවේ දෙවන වසරයි. ජාත්‍යන්තර ප්‍රජාව අප කෙරෙහි තබා ඇති විශ්වාසය ප්‍රශංසනීය වේ. ජාත්‍යන්තර වෙළඳාමෙහි නිරත ප්‍රකට සමාගම් අද ශ්‍රී ලංකාවේ ආයෝජනයට එක් වෙමින් සිටිති. එකී නව ප්‍රවණතාවල අස්වැන්න නෙලා ගනිමින් අප රටේ වරාය , නාවික සහ සමුද්‍රීය ක්ෂේත්‍රයේ දියුණුව තව දුරටත් ඇති කළ හැකි බව මගේ විශ්වාසයයි. ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමෙන් නොනැවතී සියලු පාර්ශවයන්ට මග පෙන්වීමටද වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය සූදානමිය . ශ්‍රී ලංකාවේ ආදර්ශමත් අමාත්‍යාංශයක් බවට පත් කරමින් මෙරට ආර්ථික සංවර්ධනයේ ප්‍රමුඛ සන්නාමය බවට වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශය පත්කිරීමේ ඉලක්කය සපුරා ගැනීමට ඉදිරියටත් කැපවන බවද මම අවසාන වශයෙන් ප්‍රකාශ කරමි.

**අර්ජුන රණතුංග ( පා.ම.)**
**වරාය හා නාවික කටයුතු අමාත්‍ය**



## ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

### අභියෝග හඳුනාගෙන සාර්ථකව ඉදිරියටම....

2016 වසරේ ඇතුලතින් හා පිටතින් යොමුවූ අභියෝග ජය ගෙන අපි සාර්ථක ඉදිරි ගමනකට ප්‍රවේශ වූයෙමු. එබැවින් එම වර්ෂයේ කාර්යසාධන වාර්තාවට පණිවිඩයක් තබනුයේ ඒ ගැන තෘප්තිමත්වය. ඒඅනුව, 2020 දී ගෝලීය නාවික ක්ෂේත්‍රයේ ප්‍රධාන භුවමාරු මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව පත්කිරීමේ අපේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කරගැනීමට වඩාත් ධෛර්යසම්පන්නව අපි මේ වසර තුල කැපවීමෙන් කටයුතු කළෙමු.

අමාත්‍යාංශය යටතේ ඇති වෙළඳ නාවික ලේකම් කාර්යාලය, ජගත් නාවික කර්මාන්තයේ පිලිගැනීම ඇති කර ගනිමින් උසස් තත්වයේ වෘත්තීය නැවියන් බිහිකිරීමට දායකත්වය දී ඇත. සියළු ජාතික හා ජාත්‍යන්තර රෙගුලාසි විධිවිධාන ක්‍රියාත්මක කිරීම 2016 වසරේ දී සාර්ථකව සිදුකර ඇත. 2017 වසරේදී වඩාත් සැලසුම් සහගතව ගුණාත්මක බව ආරක්ෂා වන අන්දමින් තම ඉලක්කය සපුරාගැනීමට සමත්වනු ඇත. රාජ්‍ය ව්‍යවසායක ආයතනයක් ලෙස ලංකා නැව් සංස්ථාව මිලදීගත් නැව් දෙක මගින් ගල් අඟුරු ප්‍රවාහනයේ අපේක්ෂිත ඉලක්ක 2016 වසරේදී සපුරාගනු ලැබිය. පෞද්ගලික නාවික පාසල්වල ආධුනික නැවියන්ට පුහුණුව ලබාදීම අරඹා සාර්ථකව පවත්වාගෙන යති. බාධක හඳුනාගෙන ඒවා මේ වසර තුල වඩාත් සාර්ථකව සිදුකර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අමාත්‍යාංශය සතු ප්‍රධානතම ව්‍යවසායකයා ලෙස 2017 වසරේදී කොළඹ, ත්‍රිකුණාමලය, මාගම්පුර වරායන්හි යටිතල පහසුකම් සංවර්ධනය කර උසස් තත්වයේ සේවාවන් පැවැත්වීමට සූදානම් කර ඇත. ගාලු වරාය, සංචාරක වරායක් ලෙස සංවර්ධනය කිරීම මේ වසරේ අපේ ප්‍රධාන කාර්යයක් වනු ඇත. ගාල්ල කේන්ද්‍ර කර දකුණේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට කටයුතු කරන්නේ නම් ගාලු වරායේ සංවර්ධනය සිදු නොකොට එය කල නොහැක. එම නිසා ගාලු වරාය සංවර්ධනය, සමස්ත රජයේම වගකීමක් ලෙස ඉටු කල යුතුයි .

2017 වසරේදී අප ඉලක්ක ජයගැනීමට අප ඉදිරියේ ඇති ප්‍රධාන බාධකය ලෙසට වරාය අධිකාරිය විසින් ගෙවිය යුතුව ඇති ඇති විශාල ණය මුදල් ප්‍රමානය සඳහන් කල හැකිය. මෙම මුදල් බේරුම් කිරීම සඳහා අප අනුගමනය කරන ක්‍රියාමාර්ග ආයතනයටත් රටටත් හානිකර ඒවා වියයුතු නොවේ. අමාත්‍යාංශයේ සහ එම ආයතනවල අනන්‍යතාවය රැකගෙන පෞද්ගලික ආයෝජකයින් සමග ඒ සඳහා ගිවිසුම්ගතව සාර්ථක වර්ධනයක් අපට ලබා ගතහැකි වෙතියි යන්න මගේ අදහසයි. මෙහිදී අතිගරු ජනාධිපතිතුමාගේ සහ අග්‍රාමාත්‍යතුමාගේ මඟපෙන්වීම මත ගරු අමාත්‍ය අර්ජුන රණතුංග මැතිතුමා ඉටු කරන කාර්ය භාරය අගයන්නේ ඉතා සුහදශීලිවය. අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශ විෂය පථයට නතුවන ආයතනවල ප්‍රධානින් ඇතුළු සැම අංශයකම, ශ්‍රේණියකම නිලධාරීන් සහ සේවකයින් පසුගිය වකවානුවේ ලබාදුන් සහය අගය කරමින්, 2017 වසරේදීද සාර්ථක ඉදිරි ගමනකට එම සහය ලබා දෙනු ඇතැයි විශ්වාස කරමි. ඒ සඳහා මම පූර්ණ කැපවීමෙන් ගරු අමාත්‍යතුමා ප්‍රමුඛ සියලු දෙනාට සහය දෙන බව ප්‍රකාශ කරමි .

**නිශාන්ත මුතුහෙට්ටිගම**
**ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී**
**වරාය හා නාවික කටයුතු පිලිබඳ නියෝජ්‍ය අමාත්‍ය**



**ලේකම්තුමාගේ පණිවිඩය**

ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි සුවිශේෂී බලපෑමක් ඇති කළ හැකි අමාත්‍යාංශයක් වන වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස රටේ සංවර්ධනයට දායකවීමට ලැබීම මහත් භාග්‍යයක් කොට සලකන අතර 2016 වසරේ කාර්යසාධන වාර්තාව වෙත පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ගැන බෙහෙවින් සතුටු වෙමි.

දේශීය ආර්ථිකයට ප්‍රබල දායකත්වයක් ලබාදෙන ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙන්ම සී/ ස ලංකා නැව් සංස්ථාව හා වෙළඳ නාවික ලේකම් කාර්යාලය අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන වේ. ගරු අමාත්‍යතුමාගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම හා උපදෙස් මත 2016 වර්ෂයේ මෙම ආයතන නිසි පරිදි මෙහෙයවීමට හැකිවීම සම්බන්ධයෙන් නිහතමානීව සතුටු වෙමි.

ශ්‍රී ලංකාව කඩිනම් සංවර්ධනයක් කරා රැගෙන යාමේ දැඩි අවශ්‍යතාව පෙර නොවූ ලෙස මතුවෙමින් පවතින යුගයක එම අරමුණ සාර්ථකව ළඟාකර ගැනීමේදී මෙම අමාත්‍යාංශය වෙත ඉතා සුවිශේෂී වගකීම් රැසක් පැවරී ඇත.

2016 වර්ෂයේ දී මුහුණ දීමට සිදු වූ අභියෝග හමුවේ වුවද වාර්තාගත ලාභයක් ලැබීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමත්වී ඇත. එමෙන්ම ලෝකයේ හොඳම බහළු මෙහෙයුම් වරායයන් 30 අතරට කොළඹ වරාය ගෙන ඒමට හැකිවීම ද ජයග්‍රහණයක් ලෙස සලකමි. එසේම හම්බන්තොට වරායේ දෙවන අදියර සඳහා පවරාගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමට 2016 වර්ෂය තුල රු. බිලියන 1ක මුදලක් වෙන්කර දීමට හැකිවීමද අප ලැබූ ජයග්‍රහණයක් ලෙස සලකමි. එසේම ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිත කර්මාන්ත ඇති කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කර ඇත. තවද ගාලු වරාය සංවර්ධන ව්‍යාපාතිය ආරම්භ කිරීමට බාධාවක්ව පැවති යුනෙස්කෝ ( UNESCO) අනුමැතිය ලබාගැනීමට පසුගිය වසරේ හැකියාව ලැබී ඇත.

සී/ස ලංකා නැව් සංස්ථාව විසින් මිලදී ගත් නෞකා වන " සිලෝන් බ්‍රීස් " හා "සිලෝන් ප්‍රින්සස්" 2016 වර්ෂයේදී සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කළ අතර එමගින් ලංකා නැව් සංස්ථාවේ ආදායම් ඉහල නංවා ගැනීමට මෙන්ම ශ්‍රී ලාංකිකයින්ට ඉතා ඉහළ වැටුප් ලැබීමේ අවකාශයක් පවතින නාවික ක්ෂේත්‍රයේ රැකියා ලබාගැනීමේ මංපෙත් විවර කරමින් ආධුනික කැඩෙට් නිලධාරීන් සඳහා පුහුණුවක් ලබාදීමටත් හැකියාව ලැබී ඇත. ඒ අනුව 2016 වසරේ දී ආධුනික නාවිකයින් 52 සඳහා පුහුණු අවස්ථා හිමිකර දී ඇත.

වෙළඳ නාවික ලේකම් කාර්යාලය මගින් නාවික ක්ෂේත්‍රයේ සේවයේ නියුතු විවිධ තරාතිරම් වල කාර්ය මණ්ඩලය වෙනුවෙන් සුවිශේෂී කාර්ය භාරයක් ඉටුකරනු ලබන අතර නාවිකයන් සඳහා නිකුත්කරන ප්‍රවීණතා සහතික හා අඛණ්ඩ මුදාහැරීමේ සහතික ආරක්ෂිත මූලිකාංග ඇතුලත් කර තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් නිකුත් කිරීමට 2016 වර්ෂයේදී කටයුතු ආරම්භ කරන ලදී. එසේම ISO 9001:2008 තත්ත්ව කළමනාකරණය යාවත්කාලීන කිරීමේ විගණනය හා සාමාජික රටවල් විසින් ජාත්‍යන්තර සමුද්‍රීය සම්මුතීන් මනාව ක්‍රියාත්මක කරන බවට සහතික කරනු වස් IMO අනිවාර්ය විගණනය ද සිදු කිරීමට හැකිවීම වෙළඳ නාවික ලේකම් කාර්යාලය පසුගිය වර්ෂයේ ලැබූ ජයග්‍රහණයන් ලෙස සැලකිය හැකිය. තවද වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ කටයුතු පුළුල් කිරීමේ අරමුණින් යාපනය දිස්ත්‍රික්කයේ උපකාර්යාලයක් ස්ථාපිත කිරීමට ද කටයුතු කර ඇත.

මෙම සියළුම ජයග්‍රහණයන් ළඟාකර ගැනීම සඳහා නිසි මඟපෙන්වීම් හා උපදෙස් ලබාදෙමින් අපව දිරිමත් කිරීම සම්බන්ධයෙන් ගරු වරාය හා නාවික කටයුතු අමාත්‍ය අර්ජුන රණතුංග මැතිතුමා සහ ගරු නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා වෙත මාගේ ස්තුතිය පිරිනමන අතරම මෙම ජයග්‍රහණයන් අත්කර ගැනීම සඳහා උර දුන් සියළුම ආයතන ප්‍රධානින් මෙන්ම නිලධාරීන්ටත්, අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ටත් මාගේ ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

එල්.පී.ජයම්පති

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශ ලේකම්

# පටුන

## I වන කොටස

පිටු අංකය

1. වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය 17

## II වන කොටස

පිටු අංකය

2. වෙළඳ නාවික ලේකම් කාර්යාලය 39
3. ශ්‍රී ලංකා වරාය අධිකාරිය 53
4. ලංකා නැව් සංස්ථාව 85

# වගු


| | | |
|---|---|---|
| වගුව 1 | කාර්යමණ්ඩල විස්තර - ආයතන අංශය | 25 |
| වගුව 2 | කාර්යමණ්ඩල විස්තර - ගිණුම් අංශය | 28 |
| වගුව 3 | වියදම් වාර්තාව - අමාත්‍ය කාර්යාලය | 29 |
| වගුව 4 | වියදම් වාර්තාව - ආයතන සහ පරිපාලනසේවා | 30 |
| වගුව 5 | කාර්යමණ්ඩල විස්තර - සැලසුම් හා සංවර්ධන අංශය | 32 |
| වගුව 6 | කාර්යමණ්ඩල විස්තර - විගණන අංශය | 33 |
| වගුව 7 | ගිවිසුම්ගත නාවිකයන් සංඛ්‍යාව | 44 |
| වගුව 8 | ගිවිසුම් අවසන්කල නාවිකයන් සංඛ්‍යාව | 44 |
| වගුව 9 | අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතිකපත් සංඛ්‍යාව | 45 |
| වගුව 10 | ප්‍රවීණතා සහතික සංඛ්‍යාව - නාවික | 45 |
| වගුව 11 | ප්‍රවීණතා සහතික සංඛ්‍යාව - ඉංජිනේරු | 46 |
| වගුව 12 | පොදු මෙහෙයුම්කරුවන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය | 46 |
| වගුව 13 | බහාළුම් බර සත්‍යාපනය කිරීමේ සහතිකපත් ප්‍රමාණය | 47 |
| වගුව 14 | ආදායම් ප්‍රකාශය - වෙළඳ නාවික ලේකම්කාර්යාලය | 48 |
| වගුව 15 | පුහුණුවීම් සහ වැඩමුළු - වෙළඳ නාවික ලේකම්කාර්යාලය | 49 |
| වගුව 16 | ඉදිකිරීම් ප්‍රගතිය - මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 59 |
| වගුව 17 | මූල්‍ය ප්‍රගතිය - මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 61 |
| වගුව 18 | මූල්‍ය ප්‍රගතිය - නැව් තෙල් සැපයීමේ හා තෙල් ගබඩා කිරීමේ ව්‍යාපෘතිය | 61 |
| වගුව 19 | ව්‍යාපෘති ප්‍රගතිය - කොළඹ වරායේ අභ්‍යන්තර මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 66 |
| වගුව 20 | ව්‍යාපෘති ප්‍රගතිය - ජයබහළු පර්යන්තයේ 3 වැනි පර්යන්තය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 69 |
| වගුව 21 | නෞකා පැමිණීම ප්‍රගතිය - කොළඹ වරාය | 72 |
| වගුව 22 | බහළු මෙහෙයුම් ධාරිතාවය - කොළඹ වරාය | 72 |
| වගුව 23 | නැව් බඩු ගොඩබෑම ප්‍රගතිය - කොළඹ වරාය | 73 |
| වගුව 24 | නැව් බඩු පැටවීම ප්‍රගතිය - කොළඹ වරාය | 73 |
| වගුව 25 | මෙහෙය වූ සමස්ත නැව් බඩු ප්‍රගතිය - කොළඹ වරාය | 73 |
| වගුව 26 | ප්‍රධාන නැව් බඩු වර්ග අනුව ගොඩබාන ලද ප්‍රමාණය - කොළඹ වරාය | 74 |
| වගුව 27 | ප්‍රධාන නැව් බඩු වර්ග අනුව පටවන ලද ප්‍රමාණය - කොළඹ වරාය | 75 |
| වගුව 28 | රෝ රෝ නැව් මගින් මෙහෙය වූ වාහන ප්‍රමාණය - කොළඹ වරාය | 76 |
| වගුව 29 | බහළු මෙහෙයුම් ධාරිතාවය - පර්යන්තය අනුව - කොළඹ වරාය | 76 |

| | | |
|---|---|---|
| වගුව 30 | නෞකා පැමිණීම ප්‍රගතිය - ත්‍රිකුණාමලය වරාය | 77 |
| වගුව 31 | නැව් බඩු ගොඩබෑම ප්‍රගතිය - ත්‍රිකුණාමලය වරාය | 78 |
| වගුව 32 | නෞකා පැමිණීම ප්‍රගතිය - ගාල්ල වරාය | 79 |
| වගුව 33 | නැව් බඩු ගොඩබෑම් ප්‍රගතිය - ගාල්ල වරාය | 79 |
| වගුව 34 | නෞකා පැමිණීම ප්‍රගතිය - කන්කසන්තුරය, මයිලිඩ්ඩි, ජේදුරුතුඩුව සහ කරෙයිනගර් වරායයන් | 80 |
| වගුව 35 | නැව් බඩු ගොඩබෑම් ප්‍රගතිය - කන්කසන්තුරය, මයිලිඩ්ඩි, ජේදුරුතුඩුව සහ කරෙයිනගර් වරායයන් | 80 |
| වගුව 36 | නැව් බඩු පැටවීම් ප්‍රගතිය - කන්කසන්තුරය, මයිලිඩ්ඩි, ජේදුරුතුඩුව සහ කරෙයිනගර් වරායයන් | 80 |
| වගුව 37 | නෞකා පැමිණීම ප්‍රගතිය - මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය | 81 |
| වගුව 38 | නැව් බඩු ගොඩබෑම ප්‍රගතිය - මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය | 81 |
| වගුව 39 | නැව් බඩු පැටවීම ප්‍රගතිය - මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය | 82 |
| වගුව 40 | රෝ රෝ නැව් මගින් වාහන මෙහෙයවීම ප්‍රගතිය මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය | 82 |
| වගුව 41 | නෞකා පැමිණීම ප්‍රගතිය- සියළු වරායයන් | 83 |
| වගුව 42 | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය කාර්ය සාධනය | 84 |
| වගුව 43 | නාවුක මෙහෙයුම් කටයුතු සිලෝන් බ්‍රිස් | 90 |
| වගුව 44 | නාවුක මෙහෙයුම් කටයුතු සිලෝන් ප්‍රින්සස් | 90 |
| වගුව 45 | 2015 සහ 2016 වර්ෂවල දී කෙරෙමින් පැවති කටයුතු වලින් ගත් ආදායම සන්සන්දනාත්මකව | 93 |
| වගුව 46 | 2016 කෙරෙමින් පැවති කටයුතු පිළිබඳව භෞතික හා මූල්‍ය කාර්යසාධනය | 95 |
| වගුව 47 | 01/01/2016 සිට 2016.12.31දක්වා නැව් බඩු මෙහෙයුම් කටයුතු වල කාර්ය සාධනය | 97 |
| වගුව 48 | 2016.01.01 සිට 2016.12.31 දක්වා ආදායම | 98 |
| වගුව 49 | ලංකා නැව් සංස්ථාවේ ශුද්ධ ලාභය (බදු ගෙවීමෙන් පසු ) | 99 |

# I වන කොටස

# 01. වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය

## දැක්ම

“දකුණු ආසියානු කලාපයේ උපරිම තරඟකාරිත්වයකින් යුතු සාමුද්‍රිකසේවා මධ්‍යස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම තුලින් සියලුම සේවාලාභීන්ට හිතකාමී ඉහළ මට්ටමේ සාමුද්‍රීය සේවාවන් ලබාදීම”

## මෙහෙවර

“ජාතික ආර්ථික වර්ධනය සඳහා සාමුද්‍රික ප්‍රවාහන කටයුතු ක්ෂේත්‍රය තුල දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස තරඟකාරිත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක වරාය හා නාවුක සේවාවන් සැලසීමට ඉවහල්වනවඩාත්යෝග්‍ය ප්‍රතිපත්ති රටාවක් පිළියෙළ කිරීම හා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සැකසීම”

## 1.1 කාර්යයන්

- අමාත්‍යාංශයේ විෂය පථයට නතුවන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති සමායෝජනය කිරීම හා අධීක්ෂණය කිරීම.


- අමාත්‍යාංශ විෂය පථයට අයත් වන ආයතනවල කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කරන නීතිමය රාමුවක් හඳුන්වා දීම.

- වරාය හා නාවික කටයුතු වලට අදාල සේවාලාභීන්ට වඩාත් හොඳ සේවාවන් සැලසීම සඳහා නව මෙහෙයුම් නිර්ණායකයන් හඳුන්වාදීම.

- වරාය හා නාවික කටයුතු සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාශීලී යාන්ත්‍රණයක් විධිමත්ව සැකසීම.

- නැව් ඒජන්තවරුන්, බහළු මධ්‍යස්ථාන මෙහෙයුම්කරුවන්, නැව් බඩු ඉදිරිපත් කරන්නන්, යාත්‍රා හිමිකම් නොමැති පොදු ප්‍රවාහන සේවා සපයන්නන්, සංචාරක ඒජන්තවරුන් හා වෙනත් සේවා සපයන්නන් සඳහා වඩාත් ක්‍රියාශීලී හා ව්‍යාපාර හිතකාමී නියාමනයක් හා අධීක්ෂණයක් ඇති කිරීම.

## 1.2 වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ සංවිධාන සටහන




## 1.3 වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල විස්තර

### කාර්යමණ්ඩල තොරතුරු - 2016 දෙසැම්බර් 31 දක්වා

| තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප් සංග්‍රහය | අනුමත කාර්යමණ්ඩලය | පවතින කාර්යමණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| ලේකම් | ශ්‍රී ලං ප සේ | විශේෂ | එස්එල් 4 | 01 | 01 | 0 |
| අතිරේක ලේකම් (පරිපාලන හා මුදල්) | ශ්‍රී ලං ප සේ | විශේෂ | එස්එල් 3 | 01 | 01 | 0 |
| අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී ලං ප සේ | විශේෂ | එස්එල් 3 | 01 | 01 | 0 |
| ප්‍රධාන මූල්‍ය නිලධාරි | ශ්‍රී ලං ග සේ | විශේෂ | එස්එල් 3 | 01 | 01 | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලං ප සේ | I | එස්එල් 1 | 01 | 01 | 0 |
| අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී ලං ප සේ | I | එස්එල් 1 | 01 | 01 | 0 |
| අධ්‍යක්ෂ (සැළසුම්) | ශ්‍රී ලං සැ සේ | I | එස්එල් 1 | 01 | 0 | 01 |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී ලං ග සේ | I | එස්එල් 1 | 01 | 01 | 0 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලං ග සේ | I | එස්එල් 1 | 01 | 01 | 0 |
| අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී ලං ඉ සේ | I | එස්එල් 1 | 01 | 0 | 01 |
| සහකාර ලේකම් | ශ්‍රී ලං ප සේ | III/II | එස්එල් 1 | 01 | 01 | 0 |
| ගණකාධිකාරි | ශ්‍රී ලං ග සේ | III/II | එස්එල් 1 | 01 | 0 | 01 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී ලං ප සේ | III/II | එස්එල් 1 | 02 | 01 | 01 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (සැළසුම්) | ශ්‍රී ලං සැ සේ | III/II | එස්එල් 1 | 01 | 01 | 0 |
| පරිපාලන නිළධාරි | රා ක ස සේ | අධි ශ්‍රේණිය | එම්එන් 7 | 01 | 01 (වැ.බ) | 01 |
| භාෂා පරිවර්ථක | භාෂා පරිවර්ථක | II/I | එම්එන් 6 | 01 | 01 | 0 |
| සංවර්ධන නිළධාරි | සං නි සේ | | එම්එන් 4 | 10 | 11 | -1 |
| ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | කොන්ත්‍රාත් | | 22,250/- මාසික | 01 | 01 | 0 |
| කළමනාකරණ සහකාර | රා ක ස සේ | III/II/I | එම්එන් 2 | 24 | 12 | 12 |
| රියදුරු | රියදුරු සේ | III/II/I/ විශේෂ | පීඑල් 3 | 13 | 09 | 04 |
| කා.කා.ස | කා.කා.සේ | III/II/I/ විශේෂ | පීඑල් 1 | 12 | 09 | 03 |
| වීඩියෝ කැමරා ශිල්පී | | | 14,425/- මාසික | 01 | 01 | 0 |
| ඡායාරූප ශිල්පී | | | 14,425/- මාසික | 01 | 01 | 0 |

## 1.4 වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අංශයන්



# 1.5 2016 වසර තුලදී අමාත්‍යාංශයේ ප්‍රධාන අංශයන්ගෙන් සිදු කල ප්‍රධාන කාර්යයන්

## 1.5.1 ආයතන අංශය

### 1.5.1.1 කාර්යමණ්ඩල විස්තර

(වගුව 1: කාර්යමණ්ඩල විස්තර - ආයතන අංශය)

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| අතිරේක ලේකම් (පාලන හා මුදල්) | 1 | 1 | - |
| ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් | 1 | 1 | - |
| සහකාර ලේකම් | 1 | 1 | - |
| නීති නිලධාරී | 1 | - | 1 |
| පරිපාලන නිලධාරී | 1 | - | 1 |
| භාෂා පරිවර්තක | 1 | 1 | - |
| සංවර්ධන නිලධාරී | - | 2 | (2) |
| කළමනාකරණ සහකාර | 15 | 7 | 8 |
| කාර්යාල කාර්ය සහයක | 4 | 3 | 1 |

### 1.5.1.2 ආයතන පරිපාලන ප්‍රධාන කාර්යයන්

**i.) පාර්ලිමේන්තු කටයුතු**

මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අනුව කටයුතු කිරීමේදී ඇතිවන ගැටළු විසදීමේදී, පාර්ලිමේන්තුව විසින් විවිධ අණ පනත් සම්මත කිරීමේදී, රාජ්‍ය පරිපාලන සහ මූල්‍ය කටයුතු සිදු කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය සඳහා පාර්ලිමේන්තුව සම්බන්ධවන සියළුම කාර්යයන් මෙම විෂය යටතේ සිදු කරනු ලබයි.

2016 වර්ෂය තුළදී,

- ස්ථාවර නියෝග 23/2 යටතේ ප්‍රශ්නයකට පිළිතුරු ලබාදීම
- ගරු අග්‍රාමාත්‍යතුමාගත් ප්‍රශ්න ඇසීමේ අවස්ථාව යටතේ ප්‍රශ්නයකට පිළිතුරු ලබාදිම

**ii.) වාචික පිළිතුරු අපේක්ෂිත පාර්ලිමේන්තු ප්‍රශ්ණ**

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අමාත්‍යාංශයේ විෂය පථය සම්බන්ධව විමසන ප්‍රශ්න සඳහා ගරු අමාත්‍යතුමා විසින් ලබාදෙන වාචික පිළිතුරු හා ඒ සම්බන්ධ පසුබිම් වාර්තා සැපයීම සිදු කරනු ලබයි.

2016 වර්ෂය තුළදී ගරු මන්ත්‍රීවරුන් විසින් විමසන ලද ප්‍රශ්න 8 ක් සඳහා පිළිතුරු ලබා දී ඇති අතර ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකරන ලදී.

**iii.) පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව සම්බන්ධ කටයුතු**

වරාය හා නාවික අමාත්‍යාංශය සහ අනුබද්ධිත ආයතනවල දැනට සේවයේ නියුතු සහ නියුක්තව සිටි නිලධාරීන්ගේ මෙන්ම අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන්හි පැමිණිලි සම්බන්ධව ක්‍රියාකිරීම සහ සහන සැලසීම මෙම කාරක සභාව මගින් සිදු වේ.

2016 වර්ෂය තුළදී පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව වෙතින් ලද පැමිණිළි 6ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර ඇත

**iv.) නීති හා අධිකරණ කටයුතු**

අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමේදී පැන නැගුන නීතිමය ගැටළු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන ලද නඩු 22ක් සම්බන්ධව එම දෙපාර්තමේන්තුව වෙත පිළිතුරු යවා ඇත.

**v.) මානව හිමිකම් කොමිෂන් සභාව සම්බන්ධකටයුතු**

1996 අංක 21 දරණ මානව හිමිකම් පනත මගින් පිහිටුවා ඇති මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධව විමර්ශන සිදුකර නිර්දේශ ලබාදේ. වෙනත් රාජ්‍ය ආයතන මෙන්ම මෙම අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන හා නිලධාරීන්ට විරුද්ධව විවිධ පාර්ශවයන් විසින් ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධව පරීක්ෂණ පැවැත්වීම සිදු කරනු ලබයි. 2016 වර්ෂය තුළදී වරාය භාවිතා කරන්නන්ගේ සංගම් එකමුතුව විසින් යොමු කරන ලද පැමිණිල්ලකට මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පිළිතුරු යොමු කර ඇත.

**vi.) මෝටර් රථ ආනයන බල පත්‍ර නිකුත් කිරීම**

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍ර ලේඛ අංක 01/2016 හා 2016.07.14 දිනැති ලිපිය අනුව සහනදායි පදනම මත ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිලධාරීන් 6 දෙනකු හා ලංකා නැව් සංස්ථාවේ නිලධාරීන් දෙදෙනකු වෙත වාහන ආනයන බල පත්‍ර නිකුත් කරන ලදී.

**vii.) වැන්දඹු හා අනත්දරු විශ්‍රාමවැටුප සඳහා ලියාපදිංචිය**

2016 වර්ෂය තුලදී වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා මාර්ගගත ක්‍රමවේදයට අනුව නිලධාරීන් 7 දෙනකු ලියාපදිංචි කර ලදී.

**viii.) විශ්‍රාමික කටයුතු**

අමාත්‍යාංශයේ නිලධාරීන් තිදෙනකු විශ්‍රාම ගිය අතර ඔවුන්ගේ විශ්‍රාම වැටුප කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලදී.

## ix.) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම

වරාය සහ නාවික ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් සඳහා විධිමත් එකඟතාවයක් පවත්වා ගැනීමට අවශ්‍ය පරිදි අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 69ක් 2016 වසර සඳහා ඉදිරිපත් කරන ලදී.

## x.) ඩෙංගු මර්දන වැඩසටහන

ශ්‍රී ලංකාව පුරා සීග්‍රයෙන් පැතිර යන ඩෙංගු උණ රෝගය මර්දනය කිරීම සඳහා රජය ගෙන යන වැඩසටහනට සක්‍රීය දායකත්වයක් ලබාදීමේ අරමුණින් අමාත්‍යාංශ පරිශ්‍රය සහ අනුබද්ධිත ආයතන පරිශ්‍රයන් තුළ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන හඳුනා ගැනීම සහ විනාශ කිරීම මේ යටතේ සිදුකෙරේ.ඒ සඳහා අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි

- ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ නිසි ක්‍රියාත්මකභාවය පිළිබඳ අඛණ්ඩව අධීක්ෂණය කිරීම සඳහා 2013 වර්ෂයේදී කමිටුවක් පත්කර ඇත.
- ඉහත කමිටුව විසින් සෑම සතියකට වරක්ම අමාත්‍යාංශ පරිශ්‍රය තුල හා ගොඩනැගිලිවල මදුරුවන් බෝ විය හැකි ස්ථාන පරීක්ෂා කිරීම සහ එම ස්ථාන විනාශ කිරීමට පියවර ගැනීම.
- අමාත්‍යාංශ ගොඩනැගිල්ල වටා ඇති කාණු පද්ධතිය, ජලය නිසිලෙස බැසයන ලෙස අළුත්වැඩියා කිරීම හා ජලය රැඳෙන ස්ථානවලට මදුරු නාශක දියර යෙදීම.
- ඩෙංගු මදුරුවන් විනාශ කිරීම සඳහා අමාත්‍යාංශ පරිශ්‍රය තුළ ධූමායනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- මාසිකව ඩෙංගු වාර්තා සැකසීම සහ එම වාර්තා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

## xi.) පුහුණු සහ වැඩමුළු 2016

**දේශීය පුහුණු**

- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය මගින් පවත්වන ලද ආයතන සංග්‍රහයේ විධි විධාන පිලිබඳ වැඩමුළුව සඳහා රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරීන් තිදෙනකු සහභාගී කර වීම.
- රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ USAID වැඩමුළුව සඳහා නිලධාරීන් දෙදෙනකු සහභාගී කර වීම.
- වැටුප් කළමනාකරණය පිලිබඳ එක් දින වැඩමුළුවකට නිලධාරීන් දෙදෙනකු සහභාගී කර වීම.
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/ අභ්‍යන්තර විගණකවරුන් සඳහා වන පාඨමාලාවට එක් නිලධාරියකු සහභාගිකරවීම.

**විදේශිය පුහුණු**

- ආසියාතික රටවල් සඳහා වරාය කළමණාකරණය පිළිබඳ වැඩමුළුව - චීනය සඳහා නිලධාරීන් දෙදනකු සහභාගී කරවීම.

## xii.) විශේෂිත වැඩසටහන්

- 68 වන ජාතික නිදහස් දින සැමරුම
- සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය සැමරීම
- ජගත් පරිසර දින සැමරුම

## 1.5.2 ගිණුම් අංශය

### 1.5.2.1 කාර්යමණ්ඩල විස්තර

(වගුව 2: කාර්යමණ්ඩල විස්තර - ගිණුම් අංශය)

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | 1 | 1 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - |
| ගණකාධිකාරී | 1 | - | 1 |
| සංවර්ධන නිලධාරී | 7 | 4 | 3 |
| කළමනාකරණ සහකාර | 7 | 4 | 3 |
| කාර්යාල කාර්ය සහායක | 4 | 1 | 3 |

### 1.5.2.2 ප්‍රධාන කාර්යයන්

- අයවැය ඇස්තමේන්තු සැකසීම
- අක්මුදල් ගිණුම සකස් කිරීම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මාසික අක්මුදල් සැසඳුම් වාර්තා නියමිත දිනට පිළියෙළ කිරීම
- බැංකු කටයුතු මෙහෙයවීම සහ ගෙවීම් කටයුතු සිදු කිරීම
- පුද්ගලික පඩි නඩි, අතිකාල දීමනා සහ අනෙකුත් ගෙවීම් සිදුකිරිම
- ප්‍රසම්පාදන සැලැස්මටඅනුකූලව 2016 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම, අදාල ආයතනවලට ඉදිරිපත් කිරීම සහ සැපයුම් කළමනාකරණය
- භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සකස් කිරීම
- ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම
- මූල්‍ය වාර්තා සහ  අත්තිකාරම් B ගිණුම පිලියල කිරීම
- විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම
- 2016 වසර තුලදී අමාත්‍ය කාර්යාලයට අදාලව ලබා දුන් ප්‍රතිපාදන රු. මි. 137.082 න් 91.9% වියදම් ප්‍රතිශතයක් සහ අමාත්‍යාංශයේ ආයතන හා පරිපාලන කටයුතු සඳහා වෙන් කල ප්‍රතිපාදන වන රු. මි. 160.518 න් 89.37 ක වියදම් ප්‍රතිශතයක් පවත්වාගෙන යාම.

## 1.5.2.3 වියදම් වාර්තාව - 2016

(වගුව 3: වියදම් වාර්තාව - අමාත්‍ය කාර්යාලය)

### වැඩසටහන 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

#### ව්‍යාපෘතිය 1 - අමාත්‍ය කාර්යාලය

| විෂය අංකය | කාණ්ඩයවිෂය / | ඇස්තමේන්තුව 2016(රු(. | මු .රේ .66 | පරිපූරක ඇස්තමේන්තුව (.රු) 2016 | සංශෝදිතඇස්තමේන්තුව 2016 (රු.) | සමුච්චිතවියදම(රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| | **පුනරාවර්තනවියදම්** | | | | | | |
| | **පුද්ගලිකපඩිනඩි** | | | | | | |
| 1001 | වැටුප් සහවේතන | 8,500,000.00 | | 2,800,000.00 | 11,300,000.00 | 11,072,157.51 | 97.98 |
| 1002 | අතිකාල සහනිවාඩු දින වැටුප් | 3,500,000.00 | | | 3,500,000.00 | 3,197,060.00 | 91.34 |
| 1003 | වෙනත්දීමනා | 8,200,000.00 | 175,000.00 | 1,500,000.00 | 9,875,000.00 | 9,815,876.57 | 99.40 |
| | **ගමන්වියදම්** | | | | | | |
| 1101 | දේශීය | 1,000,000.00 | 600,000.00 | | 1,600,000.00 | 1,481,292.00 | 92.58 |
| 1102 | විදේශීය | 1,000,000.00 | (200,000.00) | | 800,000.00 | 201,507.00 | 25.19 |
| | | | | | | | |
| | **සැපයුම්** | | | | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 1,500,000.00 | | | 1,500,000.00 | 1,425,358.52 | 95.02 |
| 1202 | ඉන්ධන | 8,000,000.00 | | | 8,000,000.00 | 7,641,971.26 | 95.52 |
| | | | | | | | |
| | **නඩත්තුවියදම්** | | | | | | |
| 1301 | වාහන | 3,000,000.00 | 400,000.00 | | 3,400,000.00 | 3,396,266.26 | 99.89 |
| 1302 | යන්ත්‍රසූත්‍රසහ උපකරණ | 100,000.00 | | | 100,000.00 | 64,795.58 | 64.80 |
| 1303 | ගොඩනැගිලිසහ ඉදිකිරීම් | 100,000.00 | (93,000.00) | | 7,000.00 | 6,008.70 | 85.84 |
| | | | | | | | |
| | **සේවා** | | | | | | |
| 1401 | ප්‍රවාහන | 800,000.00 | (200,000.00) | | 600,000.00 | 415,347.00 | 69.22 |
| 1402 | තැපැල සහසන්නිවේදන | 2,600,000.00 | (882,000.00) | | 1,718,000.00 | 1,358,933.09 | 79.10 |
| 1403 | විදුලිය සහජලය | 1,200,000.00 | (300,000.00) | | 900,000.00 | 845,823.17 | 93.98 |
| 1404 | කුලී සහබදු | 600,000.00 | | | 600,000.00 | 75,850.00 | 12.64 |
| 1405 | වෙනත් | 1,000,000.00 | | | 1,000,000.00 | 985,574.14 | 98.56 |
| | | | | | | | |
| | **මාරුකිරීම්** | | | | | | |
| 1502 | විශ්‍රාම ප්‍රතිලාභ | 200,000.00 | | 182,000.00 | 382,000.00 | 381,278.88 | 99.81 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **ප්‍රාග්ධන වියදම්** | | | | | | |
| | **ප්‍රතිසංස්කරණ හාවැඩිදියුණු කිරීම්** | | | | | | |
| **2001** | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 300,000.00 | | | 300,000.00 | 53,998.53 | 18.00 |
| **2002** | යන්ත්‍රසූත්‍රසහ උපකරණ | 3,000,000.00 | 500,000.00 | | 3,500,000.00 | 3,474,386.25 | 99.27 |
| **2003** | වාහන | | | 86,000,000.00 | 86,000,000.00 | 78,626,091.91 | 91.43 |
| | **ප්‍රාග්ධනවත්කම් අත්පත් කර ගැනීම** | | | | | | |
| **2101** | වාහන | | | | | | |
| **2102** | ලීබඩු සහකාර්යාල උපකරණ | 1,000,000.00 | | | 1,000,000.00 | 733,116.06 | 73.31 |
| **2103** | යන්ත්‍රසූත්‍රසහ උපකරණ | 1,000,000.00 | | | 1,000,000.00 | 824,438.00 | 82.44 |
| | මුළු එකතුව | **46,600,000.00** | | **90,482,000.00** | **137,082,000.00** | **126,077,130.43** | **91.97** |

(වගුව 4: වියදම් වාර්තාව - ආයතන සහ පරිපාලනසේවා)

## වැඩසටහන 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

## ව්‍යාපෘතිය 2 - ආයතන සහ පරිපාලනසේවා

| විෂය අංකය | කාණ්ඩය/විෂය | ඇස්තමේන්තුව 2016 (රු.) | මූ. රෙ. 66 | පරිපූරක ඇස්තමේන්තුව 2016 (රු.) | සංශෝධිත ඇස්තමේන්තුව 2016 (රු.) | සමුච්චිත වියදම (රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන වියදම් | | | | | | |
| | පුද්ගලික පඩිනඩි | | | | | | |
| 1001 | වැටුප් සහ වේතන | 24,000,000.00 | 1,100,000.00 | 7,000,000.00 | 32,100,000.00 | 32,037,936.28 | 99.81 |
| 1002 | අතිකාල සහ නිවාඩු දිනවැටුප් | 1,500,000.00 | 400,000.00 | | 1,900,000.00 | 1,754,747.23 | 92.36 |
| 1003 | වෙනත් දීමනා | 29,500,000.00 | 4,600,000.00 | 659,000.00 | 34,759,000.00 | 33,885,723.99 | 97.49 |
| | ගමන් වියදම් | | | | | | |
| 1101 | දේශීය | 600,000.00 | (100,000.00) | | 500,000.00 | 414,107.00 | 82.82 |
| 1102 | විදේශීය | 2,000,000.00 | (600,000.00) | | 1,400,000.00 | 1,347,223.83 | 96.23 |
| | සැපයුම් | | | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීයඅවශ්‍යතා | 3,000,000.00 | 1,600,000.00 | | 4,600,000.00 | 4,554,711.90 | 99.02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1202 | ඉන්ධන | 4,500,000.00 | 300,000.00 | | 4,800,000.00 | 4,586,796.18 | 95.56 |
| 1203 | කෑම සහ නිල ඇඳුම් | 200,000.00 | (70,000.00) | | 130,000.00 | 128,347.84 | 98.73 |
| 1205 | වෙනත් | 200,000.00 | (100,000.00) | | 100,000.00 | 68,906 | 68.91 |
| | නඩත්තු වියදම් | | | | | | |
| 1301 | වාහන | 4,800,000.00 | (300,000.00) | | 4,500,000.00 | 4,286,454.00 | 95.25 |
| 1302 | යන්ත්‍රසූත්‍ර සහඋපකරණ | 300,000.00 | (130,000.00) | | 170,000.00 | 157,924.87 | 92.90 |
| 1303 | ගොඩනැගිලි සහඉදිකිරීම් | 100,000.00 | (100,000.00) | | 0.00 | - | - |
| | සේවා | | | | | | |
| 1401 | ප්‍රවාහන | 2,200,000.00 | 200,000.00 | 2,859,000.00 | 5,259,000.00 | 5,214,943.51 | 99.16 |
| 1402 | තැපැල සහ සන්නිවේදන | 2,100,000.00 | (100,000.00) | | 2,000,000.00 | 1,938,849.00 | 96.94 |
| 1403 | විදුලිය සහ ජලය | 8,000,000.00 | (300,000.00 | | 7,700,000.00 | 7,640,782.90 | 99.23 |
| 1404 | කුලී සහ බදු | 23,000,000.00 | (2,500,000.00) | | 20,500,000.00 | 20,464,570.09 | 99.83 |
| 1405 | වෙනත් | 5,000,000.00 | (400,000.00) | | 4,600,000.00 | 4,546,820.43 | 98.84 |
| | මාරු කිරීම | | | | | | |
| 1503 | රාජ්‍ය ආයතන | | | 25,000,000.00 | 25,000,000.00 | 11,632,480.93 | 46.53 |
| 1505 | දායකත්ව සහ දායක මුදල් | 4,300,000.00 | (3,000,000.00) | | 1,300,000.00 | 1,289,193.71 | 99.17 |
| 1506 | රාජ්‍ය සේවක දේපල ණයපොලි | 1,200,000.00 | (500,000.00) | | 700,000.00 | 688,326.17 | 98.33 |
| 1508 | වෙනත් | 100,000.00 | | | 100,000.00 | 52,909.07 | 52.91 |
| | ප්‍රාග්ධන වියදම් | | | | | | |
| | ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම් | | | | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,000,000.00 | | | 1,000,000.00 | 514,585.50 | 51.46 |
| 2002 | යන්ත්‍රසූත්‍ර සහඋපකරණ | 400,000.00 | | | 400,000.00 | 10,925.00 | 2.73 |
| 2003 | වාහන | 1,800,000.00 | | | 1,800,000.00 | 1,787,330.32 | 99.30 |
| | ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම් | | | | | | |
| 2101 | වාහන | | 411,000.00 | | 411,000.00 | 410,200.00 | 99.81 |
| 2102 | ලීබඩු සහ කාර්යාලඋපකරණ | 2,000,000.00 | | | 2,000,000.00 | 1,804,036.45 | 90.20 |
| 2103 | යන්ත්‍රසූත්‍ර සහඋපකරණ | 1,200,000.00 | | | 1,200,000.00 | 1,158,555.00 | 96.55 |
| | කුසලතා වර්ධනය | | | | | | |
| 2401 | පුහුණු හා කුසලතා වර්ධනය | 2,000,000.00 | (411,000.00) | | 1,589,000.00 | 1,079,233.40 | 67.92 |
| | මුළු එකතුව | 125,000,000.00 | | 35,518,000.00 | 160,518,000.00 | 143,456,621.43 | 89.37 |

## 1.5.3 සැලසුම් හා සංවර්ධන අංශය

### 1.5.3.1 කාර්යමණ්ඩල විස්තර

(වගුව 5: කාර්යමණ්ඩල විස්තර - සැලසුම් හා සංවර්ධන අංශය)

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| අතිරේක ලේකම් (සැලසුම් හා සංවර්ධන) | 1 | 1 | - |
| අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | - | 1 |
| අධ්‍යක්ෂ (සංවර්ධන) | 1 | 1 | - |
| සහකාරඅධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | - |
| සහකාරඅධ්‍යක්ෂ (සංවර්ධන) | 2 | 1 | 1 |
| සංවර්ධන නිලධාරී | 6 | 3 | 3 |
| කාර්යාල කාර්ය සහායක | 3 | 2 | 1 |

### 1.5.3.2 ප්‍රධාන කාර්යයන්

- 2015 වසර සඳහා වන වාර්ෂික වාර්තාව භාෂාත්‍රයෙන්පිළියෙල කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- 2016 සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ අදාල අනෙකුත් ආයතනවලට ඉදිරිපත් කිරීම.
- 2016 වසර සඳහා අමාත්‍යාංශයේ කාර්යසාධනය හා 2017 වසර සඳහා අපේක්ෂිත වැඩසටහන් ඇතුලත් අයවැය කාරක සභා අවස්ථාව වෙනුවෙන් පිළියෙල කෙරෙන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- ගරු අමාත්‍යතුමාගේ සභාපතීත්වයෙන් යුතුව මාසික සහ විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කොට පවත්වන ලදී.
- මාසික/ ත්‍රෛමාසික/ වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙළ කිරීම, ප්‍රගති සමාලෝචනය කිරීම සහ අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම.

## 1.5.4 විගණන අංශය

### 1.5.4.1 කාර්යමණ්ඩල විස්තර

(වගුව 6: කාර්යමණ්ඩල විස්තර - විගණන අංශය)


| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| සංවර්ධන නිලධාරී | 1 | 1 | - |
| කළමණාකාර සහකාර | 1 | - | 1 |
| කාර්යාල කාර්ය සහයක | 1 | 1 | - |

### 1.5.4.2 ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශයේ සහ අමාත්‍ය කාර්යාලයේ මූල්‍ය කළමනාකරණ සුපරීක්ෂණයසහ විගණන විමසුම් ඉදිරිපත් කිරීම
- වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ මූල්‍ය කළමනාකරණ සුපරීක්ෂණය සහ විගණන විමසුම් ඉදිරිපත් කිරීම
- ශ්‍රී ලංකා වරයා අධිකාරියේ සහ ලංකා නැව් සංස්ථාවේ මූල්‍ය පරිපාලනය සම්බන්ධීකරණය සහ විගණන විමසුම් ඉදිරිපත් කිරීම
- පොදු ව්‍යාපාර පිලිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට අදාල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය
- ප්‍රසම්පාදන කළමණාකාර කටයුතු සුපරීක්ෂණය

# I I වන කොටස

# අමාත්‍යාංශයේ විෂය පථයට නතුවන ආයතන



# 02. වෙළඳ නාවික ලේකම් කාර්යාලය

# දැක්ම

"සාමුද්‍රික විශිෂ්ඨතාවය තුලින් ජගත් නාවුක කර්මාන්තයේ පිළිගැනීම"

# මෙහෙවර

"රැකියා අවස්ථා වැඩි කිරීම උදෙසා උසස් තත්වයේ වෘත්තීය නැවියන් බිහි කිරීම
ගුණාත්මක බව රකිමින් තරඟකාරී නැව් ලියාපදිංචිය පවත්වාගෙන යාම
අදාලවන සියලු ජාතික සහ ජාත්‍යන්තර සම්මුති සහ රෙගුලාසිවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම
අංශයේ නිළධාරීන්ගේ වෘත්තිමය දැනුම වර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම
ඉහල මට්ටමක කාර්යක්ෂමතාවයෙන් සහ විශ්වාසනීයත්වයෙන් යුතුව නියාමනය සහ සේවාභිමුඛ කාර්යයන් ඉටු කිරීම
සාමුද්‍රික ක්‍රියාකාරකම් හා සම්බන්ධ සෑම අංශයකම අඛණ්ඩ වර්ධනයක් ඇති කිරීම "

## 2.1 කාර්යයන්

- පිරිසිදු සාගර මත සුරක්ෂිත සහ කාර්යක්ෂම නැව් යාත්‍රා කරවීමට කැපවීම.
- මුහුදේ දී ජීවිතවල සහ දේපලවල ආරක්ෂාව සහතික කිරීම.
- මුහුදු යාත්‍රිකයන්ට විදේශීය සහ දේශීය නැව්වල රැකියා ලබාගත හැකිවන පරිදි ඔවුන්ට උසස් තත්ත්වයේ සමුද්‍රීය අධ්‍යාපනය, පුහුණුව සහ ප්‍රවීණතා ඇගයීමෙන් සහතික ලබාදීමට වගබලා ගැනීම.
- ශ්‍රී ලාංකික මුහුදු යාත්‍රිකයන් ජාත්‍යන්තර සමුද්‍රීය කර්මාන්තයට සරිලන තලයකට උසස් කිරීම.
- ශ්‍රී ලංකා ධජය යටතේ නැව් ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීමට සමීක්ෂණ සහ පරීක්ෂණ මගින් ජාත්‍යන්තර වශයෙන් පිළිගැනෙන ප්‍රමිතීන් පවත්වා ගැනීම.
- ඉන්දීය සාගර කලාපීය "වරාය රාජ්‍ය පාලනය" පිළිබඳ අවබෝධතා ගිවිසුමට අනුකූලව ශ්‍රී ලංකාවේ වරායවලට බාල තත්ත්වයේ නැව් පැමිණීම වැළැක්වීම උදෙසා "වරාය රාජ්‍ය පාලන" සමීක්ෂණ පැවැත්වීම.
- අදාලවන ජාතික සහ ජාත්‍යන්තර සම්මුති සහ ප්‍රමිතිවල විධිවිධාන වලට අනුගතව ක්‍රියාත්මක වීම නියාමනය කිරීම.
- වෙළඳ නැව් ඒජන්තවරුන්ගේ ව්‍යාපාරික කටයුතු නීත්‍යානුකූලව, සාධාරණව, නැව් අයිතිකරුවන් සහ දේශීය පාර්ශවකරුවන් යන දෙපාර්ශවයේම අන්‍යෝන්‍ය උන්නතිය වෙනුවෙන් පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම.

## 2.2 කාර්ය සාධනය -2016


### 2.2.1 නාවිකයන් සේවයේ යෙදවීම

#### 2.2.1.1 ගිවිසුම්ගත නාවිකයන්

සියළුම ශ්‍රී ලාංකික නාවිකයන් විසින් නෞකාවල රැකියාවල යෙදීමට පෙර පවතින නීති රෙගුලාසි වලට අනුව වෙළඳනාවික ලේකම් කාර්යාලයේදී ගිවිසුම් අත්සන් කිරීම අත්‍යවශ්‍ය වේ.

(වගුව 7: ගිවිසුම්ගත නාවිකයන් සංඛ්‍යාව)

| මාසය | නාවිකයන් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 589 |
| පෙබරවාරි | 560 |
| මාර්තු | 700 |
| අප්‍රේල් | 607 |
| මැයි | 618 |
| ජූනි | 636 |
| ජූලි | 653 |
| අගෝස්තු | 587 |
| සැප්තැම්බර් | 578 |
| ඔක්තෝම්බර් | 614 |
| නොවැම්බර් | 739 |
| දෙසැම්බර් | 794 |
| එකතුව | 7675 |





මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය
සටහන් අංක 1 : ගිවිසුම්ගත නාවිකයන් සංඛ්‍යාව

## 2.2.1.2 ගිවිසුම් අවසන් කල නාවිකයන්

(වගුව 8: ගිවිසුම් අවසන්කල නාවිකයන් සංඛ්‍යාව)

| මාසය | නාවිකයන් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 535 |
| පෙබරවාරි | 550 |
| මාර්තු | 515 |
| අප්‍රේල් | 505 |
| මැයි | 596 |
| ජූනි | 395 |
| ජූලි | 491 |
| අගෝස්තු | 558 |
| සැප්තැම්බර් | 577 |
| ඔක්තෝම්බර් | 640 |
| නොවැම්බර් | 629 |
| දෙසැම්බර් | 652 |
| එකතුව | 6643 |





සටහන් අංක 2: ගිවිසුම් අවසන්කල නාවිකයන් සංඛ්‍යාව
මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.2.2 සහතික නිකුත්කිරීම

### 2.2.2.1 අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතිකපත් සංඛ්‍යාව

(වගුව 9: අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතිකපත් සංඛ්‍යාව)

| මාසය | අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතිකපත් සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 86 |
| පෙබරවාරි | 88 |
| මාර්තු | 91 |
| අප්‍රේල් | 81 |
| මැයි | 106 |
| ජූනි | 148 |
| ජූලි | 114 |
| අගෝස්තු | 148 |
| සැප්තැම්බර් | 104 |
| ඔක්තෝම්බර් | 102 |
| නොවැම්බර් | 158 |
| දෙසැම්බර් | 102 |
| එකතුව | 1328 |





සටහන් අංක 3: අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතිකපත් සංඛ්‍යාව
මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

### 2.2.2.2 ප්‍රවීණතා සහතික/මුරකාවලෙහි යෙදවීමේ සහතික සංඛ්‍යාව

**නාවික අංශ**

(වගුව 10: ප්‍රවීණතා සහතික සංඛ්‍යාව - නාවික)

| සහතික වර්ගය | නිකුත්කරන ලද සහතික ප්‍රමාණය |
|---|---|
| නැව්පති (1වන පන්තිය) | 25 |
| නැව්පති නිලධාරී (2 වන පන්තිය) | 34 |
| ජලතරණ මුරකාවල් භාර නිලධාරී - සීමා රහිත (3 වන පන්තිය) | 69 |
| ජලතරණ මුරකාවල් නිකුත්වූවන් ( නිලධාරී නොවන) | 1277 |





සටහන් අංක 4: ප්‍රවීණතා සහතික සංඛ්‍යාව - නාවික
මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## ඉංජිනේරු අංශය

(වගුව 11: ප්‍රවීණතා සහතික සංඛ්‍යාව - ඉංජිනේරු)

| සහතික වර්ගය | නිකුත්කරන ලද සහතික ප්‍රමාණය |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | 16 |
| දෙවන ඉංජිනේරු | 22 |
| ඉංජිනේරු මුරකාවල් භාර නිලධාරී | 84 |
| ඉංජිනේරු මුරකාවල නියුක්තවූවන් (නිලධාරීන් නොවන) | 758 |




සටහන් අංක 5: ප්‍රවීණතා සහතික සංඛ්‍යාව - ඉංජිනේරු
මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

### 2.2.2.3 නැව් ඒජන්තවරුන් බහළුම් මෙහෙයුම් කරුවන්, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු මෙහෙයුම්කරුවන් සඳහා වර්ෂික බලපත්‍ර නිකුත් කිරීම

(වගුව 12: පොදු මෙහෙයුම්කරුවන් සඳහා නිකුත්කරන ලද බලපත්‍ර ප්‍රමාණය)

| බලපත්‍ර වර්ග | නිකුත්කරන ලද බලපත්‍ර ප්‍රමාණය |
|---|---|
| නැව් නියෝජිතයන් | **187** |
| බහළු මෙහෙයුම්කරුවන් | **24** |
| නැව් බඩු ගෙන යන්නන් හා යාත්‍රා ක්‍රියාකරුවන් නොවනපොදු මෙහෙයුම්කරුවන් | **372** |
| යාත්‍රා බලපත්‍ර | **716** |
| නැව් සමාගම් එකතු කිරීම | **54** |


මූලාශ්‍රය: අභ්‍යන්තර ලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය

## 2.2.2.4 බහාළුම් බර සත්‍යාපනය කිරීමේ සහතිකපත් නිකුත් කිරීම - 2016

(වගුව 13: බහාළුම් බර සත්‍යාපනය කිරීමේ සහතිකපත් ප්‍රමාණය)

| බලපත්‍ර වර්ග | නිකුත්කරන ලද බලපත්‍ර ප්‍රමාණය |
|---|---|
| පාලම් තරාදි සඳහා (Weigh Bridge) | 49 |
| භාණ්ඩ අපනයනකරුවන් (Shipper) | 270 |
| ප්‍රයිම්මුවර් (Prime Mover) | 498 |
| ට්‍රේලර් (Trailer) | 594 |
| ලොරිරථ ( Lorry) | 272 |

මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය





සටහන් අංක 6: බහාළුම් බර සත්‍යාපනය කිරීමේ සහතිකපත් ප්‍රමාණය

## 2.3 ආදායම් ප්‍රකාශය

වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන සේවාවන් සඳහා උපයන ලද මාසික ආදායම් පහත පරිදි වේ. (වගුව 14: ආදායම් ප්‍රකාශය - වෙළඳ නාවික ලේකම් කාර්යාලය)

| මාසය | ආදායම (රු.) |
|---|---|
| ජනවාරි | 6,144,176.61 |
| පෙබරවාරි | 3,212,816.00 |
| මාර්තු | 4,547,520.49 |
| අප්‍රේල් | 6,347,426.80 |
| මැයි | 4,757,947.07 |
| ජූනි | 9,982,057.40 |
| ජූලි | 8,786,824.40 |
| අගෝස්තු | 7,318,032.00 |
| සැප්තැම්බර් | 4,945,678.00 |
| ඔක්තෝම්බර් | 6,417,759.00 |
| නොවැම්බර් | 13,115,466.02 |
| දෙසැම්බර් | 10,521,071.60 |
| **එකතුව** | **86,096,775.39** |




මූලාශ්‍රය: අභ්‍යන්තර සංඛ්‍යාලේඛණ, වෙළඳ නාවික ලේකම් කාර්යාලය
සටහන් අංක 7: ආදායම් ප්‍රකාශය - වෙළඳ නාවික ලේකම්කාර්යාලය

බහාළුම් බර සත්‍යාපනය කිරීමේ සහතිකපත් නිකුත්කිරීමේ ගාස්තු හේතුවෙන් ජූනි -ජූලි මාස වලදීද නැව් නියෝජිත හා නැව්බඩු ගෙනියන්නන් සඳහා බලපත්‍ර නිකුත්කිරීමේ ගාස්තු හේතුවෙන් නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදීද ආදායම වැඩිවී ඇත.

# 2.4 සපුරාගත් ඉලක්කයන්

## 2.4.1 මානව සම්පත් සංවර්ධනය පුහුණුවීම් සහ වැඩමුළු

(වගුව 15: පුහුණුවීම් සහ වැඩමුළු - වෙළඳ නාවික ලේකම් කාර්යාලය)

| | පුහුණු වැඩසටහන | පුහුණුලාභීන් ගණන | | කාලසීමාව |
|---|---|---|---|---|
| | | විධායක | විධායක නොවන | |
| දේශීය | **Marine Casualty Investigation** | නාවිකවෘත්තික නිලධාරීන් (Maritime Professionals of MSS) | | දින 12 |
| | ව්‍යාපෘතිකළමනාකරණය | | 01 | දින 02 |
| | ප්‍රසම්පාදන | 01 | | දින 05 |
| | අභ්‍යන්තරවිගණනය | තත්ත්වකළමනාකරණකටයුතු සම්බන්ධනිලධාරීන් | | දින 02 |
| | කාර්යාලක්‍රම | ආයතනයේසියලුනිලධාරීන් | | දින 01 |
| | ධාරිතානැංවීම් | 01 | | දින 05 |
| | ගිණුම්කරණයේ කාර්යභාර්ය | | 01 | දින 01 |
| | උපදේශණ කුසලතා | | 01 | දින 02 |
| | කාර්යාල ක්‍රම | | 01 | දින 03 |
| | හරිත ඵලදායීතාව | | 02 | දින 01 |
| | වාර්තා ලිවීම | | 01 | දින 03 |
| | රියැදුරු කුසලතා වර්ධනය | | 01 | දින 02 |
| | ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය | 01 | | දින 03 |
| | ප්‍රසම්පාදන පුහුණු වැඩසටහන | | 01 | දින 02 |
| | **CIGAS** | | 01 | දින 03 |
| | පෞද්ගලික ලිපිගොනු | | 01 | දින 01 |
| | සිද්ධි කළමනාකරණය | | 01 | දින 03 |
| විදේශීය | දේශගුණ වෙනස්කම් ආසියානු කලාපීය සංසදය - මැලේසියාව | 01 | | දින 02 |
| | **International Convention for the Prevention of Pollution from Ships (MARPOL)** | 01 | | දින 05 |
| | **International Convention for the Prevention of Pollution from Ships (MARPOL)** | 01 | | දින 05 |
| | **Port State Control Expert Training Mission** | 01 | | දින 14 |
| | **Secretariat Level Meeting** | 01 | | දින 03 |
| | **Port development and infrastructure** | 01 | | දින 05 |
| | **International Convention for the Prevention of Pollution from Ships (MARPOL)** | 02 | | දින 05 |

## 2.4.2 IMO අනිවාර්ය විගණනය

සාමාජික රටවල් විසින් ජාත්‍යන්තර සමුද්‍රීය සම්මුතීන් මනාව ක්‍රියාත්මක කරන බවට සහතික කිරීමවස්, 2016.07.11 දින සිට 18 දක්වා ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් නම් කරන ලද විගණන පරීක්ෂකවරුන් විසින් වෙළඳ නාවික ලේකම් කාර්යාලය සහ නාවික ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් ආයතන වලට අදාල විගණනය සාර්ථකව පවත්වන ලදී.

## 2.4.3යාපනය උප කාර්යාලය

වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ කටයුතු පුළුල් කිරීමේ අරමුණින් යාපනය හා දූපත් අතර ආරක්ෂිත ලෙස මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය කිරීම හා ජැටි පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මෙම කාර්යාලයේ උප කාර්යාලයක් යාපනය දිස්ත්‍රික්කයේ පිහිටුවීමට 2016 ජුනි මස 21 දිනැති හා අමාත්‍ය මණ්ඩල තීරණ අමප/16/1043/737/026 පරිදි වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය දිස්ත්‍රික් උප කාර්යාලය 2016.09.02 දින ආරම්භ කර පහත කටයුතු සිදු කර ඇත.

i. ඉඩම් අත්පත් කිරීමේ කටයුතු
ii. අදාල නිලධාරීන් බඳවා ගැනීමට අදාල කටයුතු
iii. යෝජිත කාර්යාලයේ ගොඩනැගිල්ලේ සැලසුම් සකස් කිරීම
iv. යෝජිත ජැටිය ඉදිකිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම
v. කාර්යාල උපකරණ ප්‍රසම්පාදන කටයුතු

## 2.4.4 වෙනත්

- ලෝක සමුද්‍රීය දිනයට සමගාමීව වරාය හා නාවික සේවාවන් පිළිබඳව බස්නාහිර හා දකුණු පළාත්වල පාසල් සිසුන් 450 දෙනෙකු දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් මහපොළ පුහුණු ආයතනයේදී 2016.02.24 හා 2016.12.22 දින සාර්ථකව පවත්වා ඇත.
- නාවිකයන් සඳහා නිකුත්කරන ප්‍රවීණතා සහතික හා අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතික ආරක්ෂිත මුලිකාංග ඇතුලත් කර තොරතුරු තාක්ෂණය භාවිත කරමින් නිකුත් කිරීමට අදාල ව්‍යාපෘතියේ I අදියර අවසාන කර ඇති අතර නාවිකයන් සඳහා සහතිකපත් නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
- ශ්‍රී ලාංකික නාවිකයන්ට ස්විස්ටර්ලන්ත ධජය සහිත නෞකා වල සේවය කිරීමට අවශ්‍ය සහතිකපත් පිළිගැනීම සම්බන්යෙන් වන අවබෝධතා ගිවිසුම 2016.07.25 වන දින අත්සන් කර ඇත.
- ISO 9001: 2008 තත්ත්ව කළමනාකරණ සහතිකය යාවත්කාලීන කිරීම කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් පවත්වන ලද විගණනය 2016.09.20 දින සාර්ථකව පවත්වා ඇත.
- “Container Weight Verification” අදාල රෙගුලාසි සම්පාදනය කර ඇත. අවශ්‍ය රෙගුලාසි අංක 1979/30 දරණ 2016.08.11 වන දින අතිවිශේෂ ගැසට් පත්‍රය
- 2010 දී සංශෝධිත මෙම (STCW) ප්‍රමිතීන්ට අනුව පුහුණු කිරීම්, සහතික කිරීම්, මුරකාවලයෙහි යෙදීමේ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය නව රෙගුලාසි අංක 1987/19 දරණ 2016.10.04 වන දින අතිවිශේෂ ගැසට් පත්‍රයක් මගින් ප්‍රසිද්ධියට පත්කර ඇත.

## 2.5 ඉදිරි සැලසුම්

### 2.5.1 කෙටිකාලින

- නාවිකයන් සඳහා නිකුත්කරන ප්‍රවීනතා සහතික හා අඛණ්ඩ මුද්‍රාහැරීමේ සහතික ආරක්ෂිත මූලිකාංග ඇතුලත් කර තොරතුරු තාක්ෂණය භාවිත කරමින් නිකුත් කිරීමට අදාල ව්‍යාපෘතියේ II අදියර ආරම්භ කර ඇත.
- යාපනය හා දූපත් අතර ආරක්ෂිත ලෙස මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය කිරීම හා ජැටි පහසුකම් සංවර්ධනය කිරීම සඳහා යෝජිත වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ යාපනය දිස්ත්‍රික් උප කාර්යාලය සඳහා
    - නිලධාරීන් බඳවා ගැනීම
    - කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම
    - ජැටි නිර්මාණය
- වෙළඳ නාවික ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු යාවත්කාලින කරමින් පවතී.
- IMO සම්මුතීන් සඳහා අත්සන් කිරීම.
- IMO සම්මුතීන් සඳහා දේශීය නීතිරීති සකස්කිරිම.
- නාවිකයන් සඳහා විදේශීය ධජය සහිත නෞකා වල සේවය කිරීමට අවශ්‍ය සමානතා සහතික නිකුත් කිරීම සඳහා විදේශීය රාජ්‍යයන් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.
- ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් නිලධාරීන්ගේ ධාරිතා නැංවීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට නියමිතය.

### 2.5.2 දිගුකාලීන

- මහජනයා සඳහා විනිවිදභාවයෙන් යුතු කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා තත්ත්ව පද්ධති පවත්වාගෙන යෑම.
- නාවික ක්ෂේත්‍රයේ නව ගෝලීය ප්‍රවණතාවයන් සඳහා අවශ්‍යවන නීතිරීති ස්ථාපිත කිරීම.
- වෙරළාසන්න රෙගුලාසි සකස් කිරීම.

# 03. ශ්‍රී ලංකා වරාය අධිකාරිය

# දැක්ම

"සේද මාවතේ සමුද්‍රිය සේවා
සැපයුම් විශිෂ්ඨයා බවට පත්වීම"

# මෙහෙවර

"තිරසාර පරිසරයක් තුළ ජාත්‍යන්තර මට්ටමේ
සමුද්‍රිය සේවාවන් සැපයීම"

### 3.1 සාක්ෂාත්කර කරගැනීමට අපේක්ෂිත අභිලාෂයන්

- කොළඹ වරායේ යටිතල පහසුකම් සහ උපරි ව්‍යුහමය පහසුකම් සංවර්ධනය.
- සමුද්‍රික විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානය ලෙස කොළඹ වරායේ තත්ත්වය තහවුරු කිරීම.
- විශේෂිත අංශමය අලෙවිකරණය සහ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම.
- හම්බන්තොට වරාය ජාත්‍යන්තර තලයේ සේවාවක් ලෙස මෙන්ම කර්මාන්ත සහ බහලු මෙහෙයුම් වරායක් ලෙස සංවර්ධනය කිරීම.
- නැව් භාණ්ඩ මෙන්ම වරාය භාවිතා කරන්නන්ගේ සුරක්ෂිත භාවය මෙන්ම ආරක්ෂාව වැඩි කිරීම.
- ස්ථානීය වශයෙන් වැදගත් තැන්වල විශ්ව නියෝජනය.
- සංවිධානාත්මක ප්‍රතිව්‍යුහගත කිරීම සහ පරිපාලන ක්‍රියාපරිපාටි යලි සැලසුම් කිරීම.
- උසස් මට්ටමේ මූල්‍ය කලමණාකරනක්‍රම ක්‍රියාත්මක කිරීම.
- කාබනික පරිමාව අඩු කිරීම.
- ස්වශක්තීන් සහ තරඟකාරී වාසිදායක තත්ත්වයන් අනුව අනෙකුත් ප්‍රාදේශීය වරායන් සංවර්ධනය කිරීම.
- ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය.
- තෙල් සහ ගෑස් පහසුකම් සඳහා ප්‍රතිපාදන.
- යාත්‍රා අරමුණු කරගත් කාර්යක්ෂම සේවා.
- සංස්ථාපිත සමාජ වගකීම් (CSR) ඉටුකිරීම.

## 3.2 ව්‍යාපෘති

### 3.2.1 නැගෙනහිර බහළු පර්යන්තය (ECT) අදියර I - කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රධාන සැළැස්මෙහි බහළු නැංගුරම්පළ 03කින් සමන්විත මීටර් 1200ක දිගින් යුත් ජැටියක් නැගෙනහිර බහළු පර්යන්තය සතු වේ. කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාවයේ ඇති අඩුව පිරවීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නැගෙනහිර බහළු පර්යන්ත සංවර්ධන සැළැස්මෙහි පළමු අදියර වශයෙන් තනි නැංගුරම්පළක් ඉදිකිරීමට යෝජනා කර ඇත.

නැගෙනහිර බහළු පර්යන්තය දකුණු වරායේ දෙවැනි ගැඹුරින් වැඩි බහළු පර්යන්තය වන අතර, විස්සේ සම ඒකක මිලියන 2.4ක වාර්ෂික ධාරිතාවයක් සහ මීටර් 1200ක ජැටි බැම්මක් සහ මීටර් -18ක ගැඹුරින් යුතු වේ. නැගෙනහිර බහළු පර්යන්තය සංවර්ධනය සහ මෙහෙයුම් කිරීම සඳහා ඉදිකර, මෙහෙයුම් කර, පවරාදීමේ (BOT) සහනය ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් කරයි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය දැනටමත් ජැටි බැම්මේ මීටර් 440ක්, නුදුරින් පිහිටි අංගන ප්‍රදේශය සංවර්ධනය කර නැගෙනහිර බහළු පර්යන්තයේ වෙනත් අදාළ පහසුකම් සපයා ඇත. ව්‍යාපෘතිය ලබාගැනීම සඳහා ගණුදෙනු සඳහා උපදේශක ලෙස ආසියානු සංවර්ධන බැංකුව පත්කර ඇත.

**වර්තමාන ප්‍රගතිය**

2016 ජූනි 06 වැනි දින අභිප්‍රාය ප්‍රකාශ කිරීම (Expression Of Interest) ප්‍රසිද්ධියට පත්කිරීමත් සමඟ ව්‍යාපෘතියේ පූර්ව සුදුසුකම් ක්‍රියාවලිය ආරම්භ වූ අතර, 2016 සැප්තැම්බර් 20 දින අවසන් කරන ලදී. ආසියානු සංවර්ධන බැංකුවේ සහාය සහිතව අභිප්‍රාය ප්‍රකාශ කිරීමේ අයදුම්පත් ඇගයීම අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව මගින් සිදු කෙරෙමින් පවතී.

ආසියානු සංවර්ධන බැංකුව මගින් සකස් කරන ලද අනුග්‍රාහාත්මක ගිවිසුමේ මුල් කෙටුම්පත ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සමාලෝචනය කරන ලද අතර, අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීම සඳහා මත විමසුම ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇත.

### 3.2.2 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධන ව්‍යාපෘතිය

### 3.2.2.1 මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධන ව්‍යාපෘතිය අදියර - II

2016 දෙසැම්බර් 31 වෙනි දිනට මෙම අදියරේ ඉදිකිරීම් ප්‍රගතිය පහත පරිදි වේ.

(වගුව 16: ඉදිකිරීම් ප්‍රගතිය - මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධන ව්‍යාපෘතිය)

| කාර්යය | භෞතික ප්‍රගතිය 2016 දෙසැම්බර් 31 දක්වා |
|---|---|
| ජල නිරෝධක ඇවුරුම (ඊසාන) | 100% |
| ජල නිරෝධක ඇවුරුම (දකුණ) | 100% |

| | |
|---|---|
| ද්‍රෝණිය කැණීම (මතුපිට පස කැණීම) | 100% |
| ද්‍රෝණිය කැණීම (දෘඩ කැණීම) | 100% |
| ජැටි බැම්ම ඉදිකිරීම (කේසන්) | 100% |
| නව තෙල් පර්යන්තයේ ඉදිකිරීම | 100% |
| වරාය ද්‍රෝණිය ගැඹුරු කිරීම | 100% |
| මාර්ග සහ අංගන ඉදිකිරීම | 98% |
| කෘත්‍රිම දූපත ඉදිකිරීමේ කාර්යයන් | 100% |
| පිවිසුම් මාර්ගය ගැඹුරු කිරීම | 100% |
| වරාය මෙහෙයුම් උපකරණ ඇණවුම් කිරීම (ටග් යාත්‍රා/නැව් තෙල් සැපයීමේ බත්තල් / නියමු දියත් යාත්‍රා) | 50% |
| වරාය මෙහෙයුම් උපකරණ ලබාදීම (ටග් යාත්‍රා/නැව් තෙල් සැපයීමේ බත්තල් / නියමු දියත් යාත්‍රා) | 12% |
| පොදු සේවා පර්යන්තය | 98% |

➢ ඉන්ධන මිළ පහළයෑම සහ ඇස්තමේන්තුගත ප්‍රමාණයන්හි අඩුවීම හේතුවෙන් විශේෂයෙන් ම මිළ ගැළපුම් අඩුවීම සමඟ, ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලේ ආසන්න වශයෙන් ඇ.එ.ජ.ඩො.මිලියන 80 – 100 අතර අඩුවීමක් සිදුවන බවට දැනට වාර්තා වී ඇත. මෙය 2016.10.26 වෙනි දින පැවැත්වූ ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරීන්ගේ කමිටුවේ දී සාකච්ඡා කරන ලදී.

තෝරාගත් පාර්ශ්වය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර, බද්ධ ව්‍යාපාරයක් ලෙස සමස්ත සංවර්ධන කටයුතු සිදුකෙරෙන හෙයින්, සටහන් වලට අනුව පහත කරුණු කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

i) ගැණුම්කරුගේ ණය සක්‍රීය නොකරන ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම.

ii) දෙවැනි ණය මුදලින් ඉතිරි වූ මුදල භාවිතා කිරීමකින් තොරව අවලංගු කරන ලෙස කමිටුව ඉල්ලීමක් සිදුකර ඇත.
අදියර II යටතේ සිදුකරමින් පවතින වැඩකටයුතු සඳහා රජයේ සහන ණය අවශ්‍ය වන අතර, ව්‍යාපෘතිය/ගෙවීම් අවසන් කිරීමෙන් අනතුරුව මෙම ණය මුදලින් කොටසක් පමණක් යළි ලබාදීමට හැකිවන බව ශ්‍රී ලංකා වරාය අධිකාරිය කමිටුවට දැනුම් දී ඇත. ගැණුම්කරුගේ ණය සක්‍රීය නොකරන ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත.

iii) චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩිං සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර බද්ධ ව්‍යාපාරයක් ලෙස රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) පදනම යටතේ මුළු හම්බන්තොට වරායම මෙහෙයවීම පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම චීන රජය විසින් භාරගෙන ඇති අතර, අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගනිමින් පවතී.

iv) වරාය මෙහෙයුම් උපකරණ ඇණවුම් කිරීම සහ ලබාදීම සිදුකරමින් පවතී. කෙසේ නමුත්, උපකරණ ලබාදීම 2018 වසරේ පළමු කාර්තුව දක්වා සිදුවිය හැක.

v) අදියර II ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා 2017 අප්‍රේල් මස දක්වා කාලය දීර්ඝ කර ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

(වගුව 17: මූල්‍ය ප්‍රගතිය - මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සංවර්ධන ව්‍යාපෘතිය)

| විස්තරය | ඇස්තමේන්තුගත සමස්ත පිරිවැය (රු.මිලියන) | 2016 දෙසැම්බර් අවසන් වන විට සමුච්චිත ගෙවීම් (රු. මිලියන) |
|---|---|---|
| විදේශ ණය ආධාර (FAL) | 90,923 | 71,530 |

### 3.2.2.2 නැව් තෙල් සැපයීමේ හා තෙල් ගබඩා කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන් අවසන් කර ඇත. මෙම පහසුකම් ත්‍රිත්වයේ පැවරීමට පෙර පරීක්ෂණ 2013 වසරේ දී අවසන් කර ඇත.

**නැව් තෙල් සැපයීම සහ තෙල් ගබඩා කිරීමේ පහසුකම - මූල්‍ය ප්‍රගතිය**

(වගුව 18: මූල්‍ය ප්‍රගතිය - නැව් තෙල් සැපයීමේ හා තෙල් ගබඩා කිරීමේ ව්‍යාපෘතිය)

| විස්තරය | ඇස්තමේන්තුගත සමස්ත පිරිවැය (ඇ.එ.ජ. ඩො. මිලියන) | 2016 දෙසැම්බර් අවසන් වන විට සමුච්චිත ගෙවීම් (ඇ.එ.ජ. ඩො. මිලියන) |
|---|---|---|
| විදේශ ණය ආධාර (FAL) | 65.09 | 65.09 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 11.49 | 11.48 |
| ලංකා බැංකුව (අතිරේක ණය) | 20.88 | 19.70 |
| එකතුව | 97.46 | 96.28 |

**එල් පී ගෑස් පහසුකම සැපයීම සඳහා ලිට්‍රෝ ගෑස් ටර්මිනල්ස් ලංකා පුද්ගලික සමාගම සමඟ ඇතිකර ගත් බදු ගිවිසුම.**

හම්බන්තොට තෙල් ටැංකි සංකීර්ණයේ ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් පහසුකම මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ලිට්‍රෝ සමාගම වෙත වැඩි ආදායමක් උපයාගැනීම සහ සිලින්ඩර් පිරවීමේ කටයුතු ඉහළ දැමීම සඳහා ද්‍රව පෙට්‍රෝලියම් සිලින්ඩර් පිරවීමේ යන්ත්‍රාගාරයක් ඉදිකිරීමට ලිට්‍රෝ ගෑස් සමාගම ඉල්ලීමක් කර ඇත. ඉදිරිපත් කරන ලද යෝජනාව සමාලෝචනය කිරීමෙන් අනතුරුව ඉහත යන්ත්‍රාගාරය ඉදිකිරීම ඉදිරියට සිදුකර ගෙනයෑම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය අනුමැතිය ලබා දී ඇත. ගෑස් සිලින්ඩර පිරවීමේ යන්ත්‍රාගාරය සඳහා පරිපූරක ගිවිසුම සඳහා ලිට්‍රෝ ගෑස් සමාගම ඔවුන්ගේ මතය ඉදිරිපත් කර ඇති අතර, මේ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය ද ගිවිසුම පිළිබඳ කටයුතු අවසන් කරමින් පවතී. මේ සඳහා අනුමැතිය අපේක්ෂා කරමින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

යෝජනා සඳහා කැඳවීම් - නැව් තෙල් සැපයීමේ මෙහෙයුම් පහසුකම

නැව් තෙල් සැපයීමේ ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා ගුවන් යානා ඉන්ධන සංකීර්ණ 3 ඇතුළුව නැව් තෙල් සැපයීමේ පහසුකම සුදුසු මෙහෙයුම්කරුවෙකු වෙත බදු දීමට තීරණය කර ඇත. ඒ අනුව, නැව් තෙල් සැපයීමේ පහසුකම මෙහෙයුම් කිරීම සඳහා යෝජනා සඳහා කැඳවීම දේශීය වශයෙන් පුවත්පත් දැන්වීමක්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වෙබ් අඩවිය සහ විදේශ අමාත්‍යාංශය හරහා 2016 මාර්තු මස 30 වන දින ඉදිරිපත් කරන ලදී.

2016.05.25 වෙනි දින පැවැත්වූ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ සහ 2016.08.05 වෙනි දින පැවැත්වූ ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරින්ගේ කමිටුවේ තීරණයන්ට අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය යෝජනා භාරගැනීම අවසන් කළ අතර, ඇගයීම් ක්‍රියාවලිය ද අත්හිටුවන ලදී. යෝජනා සඳහා කැඳවීම්හි විස්තර පහත දැක්වේ.

| යෝජනා සඳහා කැඳවීම් | ප්‍රකාශයට පත් කළ දිනය | යෝජනා භාර ගැනීම සඳහා අවසන් දිනය | නිකුත් කරන ලද ලංසු ලියකියවිලි | ලැබී ඇති යෝජනාවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| නැව් තෙල් සැපයීමේ පහසුකම මෙහෙයුම් කිරීම. | 2016.03.30 | 2016.08.23 | 20 | 4 |

ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ 2016.09.14 වෙනි දින පැවැත්වූ රැස්වීමේ දී ඇගයීම් ක්‍රියාවලිය දිගටම සිදුකළ යුතු බවට තීරණය කරන ලද අතර, මුදල් අමාත්‍යාංශය සහ වරාය සහ නාවික අමාත්‍යාංශය මගින් එවන ලද සියළු යෝජනාවන් ඇගයීම් සිදුකරන ලෙසට හා එහි ප්‍රතිඵල ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත දැනුම් දෙන ලෙසට උපදෙස් ලබා දී ඇත.

කෙසේ නමුත්, ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ උපදෙස් පරිදි වරාය සහ නාවික අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2016.11.22 දින ලංකා ඛණිජතෙල් සමාගම මගින් එවන ලද යෝජනාවන් ඇගයීම් සිදු නොකරන ලෙසට හා පෞද්ගලික සමාගම් මගින් එවන ලද යෝජනාවන් පමණක් ඇගයීම් සිදුකළ හැකි බවට තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත දැනුම් දී ඇත.

**යෝජනා සඳහා කැඳවීම් (RFP) – 2016 (අප්‍රේල්)**

යෝජනා සඳහා කැඳවීම් 2016 (අප්‍රේල්) ලේඛනය 2016.04.25 වැනි දින සිට සකස්කර ඉදිරිපත් කළ අතර විභව්‍ය ආයෝජකයන් යෝජනා සඳහා කැඳවීම් ලේඛනය මිලදී ගන්නා ලදී. භාරගත් ලංසු 2016.08.24 වැනි දින විවෘත කළ අතර ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ උපදෙස් මත පදනම්ව ඇගයීම් කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී.

ද්‍රව පෙට්‍රෝලියම් වායු පර්යන්ත ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම සඳහා සහාය දැක්වීම වෙනුවෙන් ලාෆ් ටර්මිනල්ස් සමාගම සමඟ සම්බන්ධීකරණය නොකඩවා සිදුකරන ලදී.

මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය සඳහා ජල සහ විදුලි සැපයුම ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

**ඉඩම් අත්පත් කරගැනීම / මිළදී ගැනීම (අදියර II)**

අවශ්‍ය ඉඩම් සහ නැවත පදිංචි කිරීම සඳහා විකල්ප ඉඩම් මේ වනවිටත් හඳුනාගෙන ඇති අතර සමීක්ෂණ හා තක්සේරු කාර්යයන් අවසන්කර ඇත.මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අනුමැතීන් ලබාගෙන ඇත.

මේ සඳහා අවශ්‍ය සමස්ත අරමුදල දළ වශයෙන් රුපියල් මිලියන 2000කි. ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ දී ගත් තීරණයකට අනුව මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබාගැනීම සඳහා වරාය හා නාවික අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කර ඇති අතර අනුමැතිය ලබාගෙන ඇත.

ඒ අනුව, වන්දි සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත රුපියල් මිලියන 888ක මුදලක් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇත.

## 3.2.3 ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය

### 3.2.3.1 ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය - අදියර I

**භෞතික ප්‍රගතිය**

සමස්ත ව්‍යාපෘතිය සඳහා දියකඩන ඉදිකිරීම සහ ප්‍රවේශ මාර්ගය සහ පර්යන්තය ඉදිරිපිට හැරවුම් ද්‍රෝණිය කැණීම ආදිය අයත් වේ. සැලසුම් කාර්යය ඉටුකිරීම සඳහා ඔරියන්ටල් කන්සල්ටන් සමාගම (OCC) සමඟ අළුත්කරන ලද ගිවිසුමක් අත්සන් තබන ලදී.

දියකඩනය ඉදිකිරීමේ කටයුතු ඉතිරිව ඇති JICA අරමුදල් භාවිතා කර සිදුකිරීමට සැලසුම් කර ඇති අතර දෙවන අදියරේ දී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) මත බහුකාර්ය නැංගුරම්පලක් සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත. අනුමත ණය මුදල ජපන් යෙන් මිලියන 14,495කි.

**වර්තමාන ප්‍රගතිය**

අවසාන යෝජනාව මත පදනම්ව ඔරියන්ටල් උපදේශක සමාගම දළ අතිරේක සැලසුම් වාර්තාව සහ ලංසු ලියකියවිලි වෙළුම I,II,III සහ IV සකස් කර ඇත. ලංසු ඇගයීමේ කාර්යය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගන්නා ලදී.

පහත සඳහන් ආයතනයන්ගෙන් අවශ්‍ය අනුමැතිය දැනටම ලබා ඇත.

- ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව (EIA)

සංශෝධිත විෂය පථය සමඟ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කෙරේ.

### 3.2.3.2 ගාලු වරායේ විනෝද යාත්‍රා, රුවල් යාත්‍රා අළුත්වැඩියා කිරීම, නැව් නිෂ්පාදන පහසුකම් ඇති කිරීම.

| | |
|---|---|
| ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය | - ඇ.එ.ජ.ඩො. මිලියන 44 |
| ඉදිකිරීම් කාලය | - මාස 24 |
| ආයෝජක | - හඩි හමාම් ග්‍රෑප් ඔෆ් සවුදි ඇරබියා |
| ව්‍යාපෘති යෝජකගේ නම | - සී ගල්ෆ් ෂිප්යාඩ් පුද්ගලික සමාගම (ශ්‍රී ලංකාව) |

**ව්‍යාපෘතියේ මූලික පරමාර්ථ**

- රුවල් යාත්‍රා, විනෝද යාත්‍රා ආදිය නැවැත්වීම සඳහා ටොන් 1500 ධාරිතාවයකින් යුත් සින්ක්‍රොලිෆ්ට් එකක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම.
- ෆොමෙන්ටෙරා බත්තල් ක්ලොසන්බර්ග් ජැටියෙන් ඉවත් කිරීමෙන් පසුව තාවකාලිකව ටොන් 4500ක ධාරිතාවයකින් යුතු නැව් අළුත්වැඩියා කිරීම සඳහා පාවෙන බත්තල් ස්ථානගත කිරීම, වැඩ කිරීම සඳහා ඉඩකඩ සහ වැඩබිමක් සඳහා ගුදමක් බද්දට ගැනීමට ඔවුන් අපේක්‍ෂා කෙරේ.
- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉඩම් අන්සතු කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාරව මෙම භූමි ප්‍රදේශය වසර 30 සඳහා බදු දීම.

**ශ්‍රී ලංකා වරාය අධිකාරියට අත්වන ප්‍රතිලාභ**

- ඉඩම් බදු මුදල්, වරාය ගාස්තු සහ රාජ්‍ය භාග ගෙවීම් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ආදායම් ලෙස ලැබේ.
- ගාලු වරායේ විනෝද යාත්‍රා ප්‍රවර්ධනය සඳහා රුවල් යාත්‍රා අළුත්වැඩියා කිරීම අත්‍යාවශ්‍ය වේ.

**ව්‍යාපෘති ප්‍රගතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපාර ගිවිසුම සහ වැඩබිම සඳහා වන භූමිය බදුදීමේ ගිවිසුම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ සී ගල්ෆ් ෂිප්යාඩ් පුද්ගලික සමාගම අතර 2013 ජුනි 06 දින අත්සන් තබන ලදී. ඒ අනුව, ගිවිසුම ක්‍රියාත්මක වන දිනය 2013 ජූලි 01 වේ.

සංවර්ධක විසින් ගෙවිය යුතු මුදලින් කොටසක් ගෙවා ඇති අතර වැඩබිම සඳහා වන භූමියේ ගෙවිය යුතු බදු මුදලින් ගෙවීමට ඇති ඉතිරි මුදල සහ පෙර වර්ෂ සඳහා පොළිය ගෙවීමට ඇත.

ආයෝජකයා ගිවිසුමට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් ගිවිසුම අවසන් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය තීරණයක් ගෙන ඇත. ඒ අනුව, ගිවිසුම අවසන් කිරීම සඳහා ලිපියක් යවා ඇත.

මේ අතරතුර, සමාගමේ කොටස් වල සංයුතිය වෙනස්ව ඇති බව සහ කළමනාකරණ අයිතීන් වෝකර්ස් ෂිප්යාර්ඩ් පුද්ගලික සමාගම විසින් ලබාගෙන ඇති බවට ආයෝජකයා දැනුම් දී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගිවිසුම අවසන් කිරීමට ගත් තීරණය යළි සැලකිල්ලට ගනිමින් වැඩකටයුතු සිදුකරගෙන යාමට නව කළමනාකාරීත්වය ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අවසර ඉල්ලා ඇත.

### 3.2.4 ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය

ත්‍රිකුණාමල සෛද්ධාන්තික ප්‍රධාන සැලැස්ම කෙටි කාලීන සහ දිගු කාලීන ව්‍යාපෘති යෝජනා මත පදනම්ව සකස්කරන ලදී. මහ නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මගින් යෝජිත සංවර්ධන කටයුතු පිළිබඳ සිදුකරන ලද මූලික පාරිසරික අධ්‍යයනය ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලැබී ඇත.

ඕෂන්පික් පෞද්ගලික සමාගමේ ආයෝජන යෝජනාවට අනුව, ත්‍රිකුණාමල බොක්ක තුළ මත්ස්‍ය වගා ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීමට හා මෙහෙයුම් කිරීම සඳහා ව්‍යාපාර ගිවිසුමක් සකස් කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අවසන් කරමින් පවතී.

ද්‍රවීකරණය කරන ලද ස්වභාවික වායු (LNG) පර්යන්ත ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ආයෝජකයා සමඟ ව්‍යාපාර ගිවිසුමකට එළැඹීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අපේක්ෂා කෙරේ.

ත්‍රිකුණාමලය වරායේ සිට ගල් අඟුරු සහ ක්ලින්කර්, දුම්රිය මගින් ප්‍රවාහනය ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස හඳුනාගන්නා ලදී. අෂ්රොෆ් ජැටිය දක්වා දුම්රිය මාර්ගය සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දිසාපති සහ දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව කටයුතු කරයි.

### 3.2.5 ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා යෝජිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල

පාරිභෝගික සේවාවේ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සියළුම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවාවන් එකම ස්ථානයක දී සිදුකිරීමට ඉඩ සැළසීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට සැළසුම් කරමින් පවතී.

**වර්තමාන ප්‍රගතිය**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොළඹ වරායේ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය කාර්යාල ඉඩකඩ ලබාගැනීම සඳහා පුද්ගලික ඉඩම් සංවර්ධකයෙකු සමඟ සෛද්ධාන්තික ව්‍යාපාර ආකෘතියක් සැකසීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලදී. ආයෝජක විසින් ආයෝජනය කළ මුදල උපයාගනු ලැබේ.

මේ සඳහා උචිත ස්ථානය කැනල් අංගනය ලෙස හඳුනාගෙන ඇති අතර දැනට සේව්‍යයාගේ අවශ්‍යතාවයන් හඳුනාගෙන ඇත. ගොඩනැගිල්ල සඳහා අරමුදල් ආයෝජනය කිරීමේ සෛද්ධාන්තික ආකෘතිය හඳුනාගැනීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකෙරෙනු ඇත.

### 3.2.6 කොළඹ වරායේ අභ්‍යන්තර මාර්ගය පුළුල් කිරීම

දකුණු වරාය සංවර්ධන කටයුතු අවසන්වීමත් සමඟ වරාය පරිශ්‍රය තුල ඇතිවිය හැකි යැයි අපේක්ෂිත මාර්ග තදබදයට මුහුණදීම සඳහා ඉඟුරුකඩේ හංදියේ සිට ගේට්ටු අංක 01 දක්වා දිවෙන දැනට පවතින මංතීරු 04කින් යුත් අභ්‍යන්තර වරාය මාර්ගය මංතීරු 06ක් දක්වා පුළුල් කිරීමට අවශ්‍යව ඇත. මාර්ගය පුළුල් කිරීමට සමගාමීව වරාය පරිශ්‍රයේ දැනට පවතින පාලම් දෙක සහ වරාය පිවිසුම් මාර්ගයේ ඇති බ්ලූමැන්ඩල් මාර්ගය හරහා දිවෙන පාලම ද පුළුල් කිරීම අවශ්‍ය වේ.

මංතීරු 06ක් දක්වා මාර්ගය පුළුල් කිරීම සඳහා දැනට පවත්නා ගොඩනැගිලි, කාර්යාල, වැඩබිම් හා පහසුකම් ආදිය කඩා බිඳ දමා වෙනත් ස්ථානයක ස්ථානගත කිරීම අවශ්‍ය වේ. අභ්‍යන්තර වරාය මාර්ගය පුළුල්කිරීමේ කටයුතු 2013 වසරේ දී ආරම්භ කරන ලද අතර ගොඩනැගිලි කඩා බිඳ දැමීමේ කාර්යය සම්පූර්ණයෙන් ම අවසන් ප්‍රදේශයන්හි ඉදිකිරීම් කටයුතු අදියර වශයෙන් සිදුකෙරේ.

**ව්‍යාපෘති ප්‍රගතිය**

- හර්තාල් පාලම පුළුල් කිරීම රුපියල් මිලියන 219ක සමස්ත පිරිවැයකට අවසන් කර ඇත.
- සේවා නල එළීම, මතුපිට තාර තට්ටු දැමීම, මාර්ග සලකුණු ආදිය ඇතුළුව මාර්ගය කි.මී.1.4ක් පමණ දුර ප්‍රමාණයක් සම්පූර්ණයෙන් ඉදිකර අවසන් කර ඇති අතර කි.මී.1.2ක ඉතිරි දුර ප්‍රමාණය මතුපිට තාර තට්ටුව තෙක් අවසන් කර ඇති අතර කි.මී.1.2ක් දිග මාර්ගයේ වැඩකටයුතු ආරම්භ කර නොමැත. ඉදිකිරීම් කටයුතු සිදුකෙරෙමින් පවතී.

(වගුව 19: ව්‍යාපෘති ප්‍රගතිය - කොළඹ වරායේ අභ්‍යන්තර මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය)

| අංකය | විස්තරය/කාර්යය | ප්‍රගතිය/පිරිවැය | සැලකිය යුතු කරුණු/ගැටළු |
|---|---|---|---|
| 01 | ගේට්ටු අංක 01 සිට හර්තාල් පාලම දක්වා මාර්ගය (චේන් 0+020 සිට 0+මීටර් 400 දක්වා) | ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇත. සමස්ත පිරිවැය රුපියල් මිලියන 94.5කි. | |
| 02 | හර්තාල් පාලම පුළුල් කිරීම (චේන් 0 + 400 සිට 0+ මීටර් 540 දක්වා) | ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇත. සමස්ත පිරිවැය රුපියල් මිලියන 219.0කි. | |
| 03 | ශ්‍රී ලංකා නාවුක සේවා මධ්‍යස්ථානය, රංගල සිට ඉන්ධන පිරවුම් හල දක්වා මාර්ගය (චේන් 0 +840 සිට 1+ මීටර් 260 දක්වා) | අදියර I - වැඩකටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇත. මතුපිට තාර තට්ටුව තෙක් සහ ගොඩබිම දෙසට ඇති සේවා සපයන පටු තීරුවේ ඉදිකිරීම් කටයුතු රුපියල් මිලියන 112.5ක සමස්ත පිරිවැයකට අවසන් කරන ලදී. | අදියර II - මුහුද දෙසට ඇති සේවා නල සහ ඇස්ෆෝල්ට් තාර තට්ටුව තෙක් ඉදිකිරීම් සිදුකිරීමට නියමිතය. කළමනාකරණ තීරණය ප්‍රකාරව ව්‍යාපෘතිය වෙනස් කරන ලදී. |
| 04 | ඉන්ධන පිරවුම් හල සිට CFS 3 දක්වා මාර්ගය (චේන් 1+260 සිට 1+ මීටර් 700 දක්වා) | අදියර I - සේවා සැපයුම් නල ඇතුළුව මතුපිට තාර තට්ටුව තෙක් මාර්ගයේ ඉදිකිරීම් රුපියල් මිලියන 61.0ක පිරිවැයකට ඉදිකර අවසන්කොට ඇත. අදියර II - සේවා සැපයුම් නල, මීටර් 100 දිග පදික වේදිකා සහ මීටර් 400 දුරට ඇස්ෆෝල්ට් තාර තට්ටුව දැමීම | |

| | | | |
|---|---|---|---|
| | | ආදිය සඳහා 2015 ජූලි මසදී රුපියල් මිලියන 53.0 ක සමස්ත පිරිවැයකට කොන්ත්‍රාත්කරු හට ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත්කරු වැඩ බිමෙහි සේවකයන් යොදවා ඇති අතර රුපියල් මිලියන 44.9ක මුළු පිරිවැයකට වැඩ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇත. | |
| 05 | වෛද්‍ය මධ්‍යස්ථානයේ සිට CFS – 3 දක්වා මාර්ගය (චේන් 1 +700 සිට 2 + මීටර් 060 දක්වා) | අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලය යටතේ ටෙන්ඩර් ක්‍රියාවලිය සිදුකෙරෙමින් පවතී. ලංසු ඇගයීම අවසන්කර ඇති අතර, අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත්කර ඇත. | |
| 06 | වෛද්‍ය මධ්‍යස්ථානයේ සිට ජයබහළු පර්යන්තයI දක්වා මාර්ගය (චේන් 2 + 060 සිට 2+ මීටර් 460 දක්වා) | ටෙන්ඩරය රුපියල් මිලියන 75.0ක සමස්ත පිරිවැයකට 2014 ජූනි මස දී ප්‍රදානය කරන ලදී. රුපියල් මිලියන 51.1ක මුළු පිරිවැයකට වැඩ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇත. | |
| 07 | ජයබහළු පර්යන්තය I සිට සමර්හිල් ප්‍රදේශය දක්වා මාර්ගය (චේන් 2 + 460 සිට 3+ මීටර් 160 දක්වා) | මතුපිට තාර තට්ටුව දක්වා මාර්ගය ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇත. ඉතිරි වැඩකටයුතු සඳහා සැලසුම් සහ ටෙන්ඩර් ලියකියවිලි සකස් කෙරෙමින් පවති. | කළමනාකරණ තීරණය ප්‍රකාරව ව්‍යාපෘතිය වෙනස් කරන ලදී. |
| 08 | ටනල් ගේට් (Tunnel Gate) සිට පැරණි සේරම් ගේට්ටුව දක්වා මාර්ගය (චේන් 3 + 340 සිට 4 + මීටර් 020) | සැළසුම් කිරිම සහ ටෙන්ඩර් ලියකියවිලි සකස්කිරීම සිදුකෙරෙමින් පවතී. | |

## 3.2.7 වරාය පිවිසුම් මාර්ගය පුළුල් කිරීම

### 3.2.7.1 බ්ලූමැන්ඩල් මාර්ගය හරහා ඇති දැනට පවතින පාලම පුළුල් කිරීම.

අභ්‍යන්තර වරාය මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ බ්ලූමැන්ඩල් මාර්ගය හරහා ඇති දැනට පවතින පාලම පුළුල් කිරීම අවශ්‍ය වේ. 2014 දෙසැම්බර් මස දී රුපියල් මිලියන 30.0ක සමස්ත පිරිවැයකට අත්තිවාරම් ශක්තිමත් කිරීම සඳහා ගිල්වන කුළුණු සකසා අවසන් කර ඇත.

පොළොව මට්ටමින් යට ව්‍යුහයන් සහ පොළොව මට්ටමින් ඉහළට ව්‍යුහයන් ඉදිකිරීම 2015 ජනවාරි මස දී රුපියල් මිලියන 50.0ක සමස්ත පිරිවැයකට කොන්ත්‍රාත්කරු හට ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතිය අවසන් කර ඇති අතර, මේ වනවිට ගෙවීම් කර ඇති මුදල රුපියල් මිලියන 24.3කි.

### 3.2.7.2 වරාය පිවිසුම් මාර්ගය පුළුල් කිරිම

පස පිළිබඳ පරීක්ෂාව අවසන් කර ඇති අතර මාර්ගය පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර දැනට පොළොව යට ඇති දුර්වල/නුසුදුසු පස් තට්ටු සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. එබැවින්, පස සංවර්ධනය සහ මාර්ගය පුළුල් කිරීමේ වැඩ කටයුතු සැළසුම් කිරීම සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයෙන් (CECB) යෝජනාවක් ලබාගන්නා ලද අතර එය මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කර ඇත. එම කටයුතු මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට (CECB) ප්‍රදානය කර ඇති අතර වැඩ කටයුතු සිදුකෙරෙමින් පවති.

පාංශු පරීක්ෂාව අවසන් කර ඇති අතර, සැලසුම් කටයුතු සඳහා කෙටුම්පත් වාර්තාව මධ්‍යම ඉංජිනේරු හා උපදේශන කාර්යාංශය වෙත ඉදිරිපත්කර ඇත.

## 3.2.8 කොළඹ වරායේ අංගන, පර්යන්තවල ගල් අතුරා තාර දැමීමේ කාර්යයන්

### 3.2.8.1 නියමු පාලම සහ බණ්ඩාරනායක ජැටි පාලම

නියමු පාලම සහ බණ්ඩාරනායක ජැටි පාලම සම්පූර්ණයෙන්ම විශාල වලවල් නිසා ගිලාබසින හෙයින් එය මෙම ජැටි පාලම් වල මෙහෙයුම් කාර්යයන්ට බලපාන අතර දැනට පවතින නියමු පාලමේ සහ බණ්ඩාරනායක ජැටි පාලමේ මතුපිට සැකසීම හා සංවර්ධනය කිරීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

## 3.2.8.2 ජයබහළු පර්යන්තයේ 3 වැනි පර්යන්තය ප්‍රතිසංස්කරණය කිරීම.

බොහොමයක් බහළු අඩුක් කිරීමේ ප්‍රදේශ සහ මාර්ගවල යම් යම් ප්‍රදේශ ගිලා බැසීමට ලක්ව ඇති හෙයින් දැනට පවතින බහළු අඩුක් කිරීමේ අංගන ද ඇතුළුව ජයබහළු පර්යන්ත - 3හි ඇති මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. පර්යන්තයේ එදිනෙදා සිදුකෙරෙන බහළු මෙහෙයුම් කාර්යයන්ට බාධා නොවන ලෙස ප්‍රතිසංස්කරණ කටයුතු අදියර වශයෙන් කරනු ලැබේ.

මෙම කාර්යයන් යටතට පහත කාර්යයන් ද අන්තර්ගත වේ.

- ගිලාබැසීමට ලක්වී ඇති රබර් ටයර් යෙදූ ගැන්ට්‍රි ක්‍රේන් කොන්ක්‍රීට් මාර්ගය ඔසවා යථා තත්ත්වයට පත්කිරීම.
- ගිලාබැසීමට ලක් වී ඇති බහළු අඩුක්කිරීමේ ස්ථාන ඔසවා යථා තත්ත්වයට පත්කිරීම.
- දැනට පවතින මාර්ග වලට ඇස්ෆෝල්ට් සැපයීම සහ තාර තට්ටුව දැමීම.
- අංගන වල භූමිය සලකුණු කිරීම.

**ව්‍යාපෘති ප්‍රගති සමාලෝචනය**

(වගුව 20: ව්‍යාපෘති ප්‍රගතිය - ජයබහළු පර්යන්තයේ 3 වැනි පර්යන්තය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය)

| අංකය | කාර්යය / විස්තරය | ප්‍රගතිය / පිරිවැය |
|---|---|---|
| 01 | නියමු පාලමේ ගල් අතුරා තාර දැමීමේ වැඩ කටයුතු | රුපියල් මිලියන 49.6ක මුළු පිරිවැයකට ව්‍යාපෘතිය අවසන් කර ඇත. |
| 02 | බණ්ඩාරනායක ජැටි පාලමේ ගල් අතුරා තාර දැමීම - අදියර I | රුපියල් මිලියන 24.73ක සමස්ත පිරිවැයකට ව්‍යාපෘතිය අවසන්කර ඇත. |
| 03 | බණ්ඩාරනායක ජැටි පාලමේ ගල් අතුරා තාර දැමීම - අදියර II | සාර්ථක කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර, ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. |
| 04 | ජය බහළු පර්යන්තයේ 3 පර්යන්තයෙහි R&S මංතීරු නැවත ඉදිකිරීමේ කටයුතු | ව්‍යාපෘතිය අවසන්කර ඇති අතර, මේ දක්වා සිදුකර ඇති ගෙවීම රුපියල් මිලියන 38.04කි. |
| 05 | ජයබහළු පර්යන්තයේ 3 වෙනි පර්යන්තයේ DM සහ N මංතීරු නැවත ඉදිකිරීමේ කටයුතු | කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීම සඳහා පුවත්පත් දැන්වීම් හරහා ටෙන්ඩර් කැඳවන ලදී.ටෙන්ඩරය ප්‍රදානය කිරීම සඳහා ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර තාක්‍ෂණික ඇගයීම් කමිටුව මගින් ලංසුකරු නිර්දේශ කරන ලදී.<br>ටෙන්ඩරය ප්‍රදානය කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමට නියමිතය. |
| 06 | විජය කුමාර ජැටියේ ගල් අතුරා තාර දැමීමේ කටයුතු | කොන්ත්‍රාත්තුව සාර්ථක කොන්ත්‍රාත්කරු හට ප්‍රදානය කරන ලදී. |

## 3.2.9 ඔලුවිල් වෙරළ තීරයේ පාංශු විස්ථාපනය පිළිබඳ පුළුල් අධ්‍යයනය

ඔලුවිල් වරායට ඔබ්බෙන් පිහිටි උතුරු සීමාවේ වර්තමානයේ සිදුවන වෙරළ ඛාදනය, දකුණු සීමාවේ දකුණු දියකඩනය දිගට විශාල වශයෙන් වැලි එක්රැස්වීම, පිවිසුම් ඇළ මාර්ගය තුළ හා අවට රොන්මඩ ඉවත් කිරීම ආදී ගැටළු සඳහා පිළියම් ලෙස ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කර ඇත. මෙවැනි කාර්යයන් සඳහා ප්‍රාරම්භයක් ලෙස ඔලුවිල් වෙරළ ආශ්‍රිතව වැලි අංශු ගමන්කරන ආකාරය සහ අනාගතයේ සිදුවිය හැකි වෙනස්කම් තීරණය කිරීම සහ පිළියම් ලෙස ගත හැකි ක්‍රියාමාර්ග සැකසීම සඳහා පුළුල් ඉංජිනේරු අධ්‍යනයක් සිදුකිරීමට යෝජනා කර ඇත.

ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදල් සැපයීමේ නියෝජිත ආයතනය වන ඩෙන්මාර්ක් විදේශ කටයුතු අමාත්‍යාංශය (DANIDA) මෙම අධ්‍යයනය සඳහා මූල්‍ය සහාය, දීමනා ලබාදීමේ පදනම යටතේ ලබාදිමට එකඟ වී ඇත.

සාර්ථක උපදේශක වන ඩෙන්මාකයේ සීමාසහිත ඩැනිෂ් හයිඩ්‍රොලික් ආයතනය වෙත වරාය හා නාවික අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ප්‍රතිග්‍රහන ලිපියක් (Letter of Acceptance) නිකුත් කළ අතර, අධ්‍යයනය ආරම්භ කර ඇත. ඩැනිෂ් හයිඩ්‍රොලික් ආයතනය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ සමීක්‍ෂණ කටයුතු, වැඩබිම් පරීක්‍ෂාව සහ තක්සේරු කිරීමේ අවසන් රැස්වීම පවත්වා ඇත. අතුරු වාර්තාව ඉදිරිපත් කර ඇත.

### 3.2.10 බහළුගත නැව්බඩු මෙහෙයුම් මධ්‍යස්ථානය (CFS– 01) ගුදම ප්‍රතිෂ්ඨාපනය කිරීම

2013 වසරේ මැයි මස ගිනි ගැනීමක් හේතුවෙන් හානියට පත් වූ CFS 01 ගුදම ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කටයුතු 2016 ජනවාරි මසදී ආරම්භ කරන ලදි.

මුළු ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී සැලැස්ම හා කාලරාමුව සකස්කර අදාළ කොට්ඨාස සඳහා වැඩ කටයුතු පවරන ලද අතර 2016.08.01 දිනට ගුදමේ මුල් භාගයේ ඉදිකිරීම් අවසන් කර, 2016.08.10 දින සේවා සැපයීමේ කටයුතු ආරම්භ කරන ලදී. ගුදමේ දෙවන භාගයේ ඉදිකිරීම් කටයුතු 2017 ජනවාරි මස අවසානයේ දී නිමකිරීමට නියමිත ය.

- අවශ්‍ය සියළුම පහසුකම් සහිතව (මීටර 40 x 52.5)සමඟ ගුදමේ මුල් භාගයේ මීටර 45 x මීටර 52.5ක ප්‍රමාණයක් ඉදිකිරීම අවසන් කර ඇත. වර්ග මීටර 600 ක ඉඩ ප්‍රමාණයක් සහිත දෙමහල් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයක් සහ දෙපසින් මීටර 2.5ක වේදිකාවක් සහිත වර්ග මීටර 1800ක ඉඩ ප්‍රමාණයක් සහිත ගුදම සහ සේවා සැපයුම් කටයුතු සඳහා විදුලි පරිණාමයන්ගෙන් සමන්විත වේ. සේවා සැපයුම් කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.
- ප්‍රධාන වානේ රාමු, වහලය සහ වහල ආවරණ කටයුතු ඉදිකිරීම අවසන් කර ඇත.

### 3.2.11 ඔලුවිල් හි වෙරළබඩ සංරක්ෂණ කටයුතු - ඔලුවිල් නිවාඩු නිකේතනය සහ භූමිය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය

### 3.2.11.1 අදියර 1 - මීටර් 150ක දුර ප්‍රමාණය සඳහා රුඳවුම් බැම්ම ඉදිකිරීම (නිවාඩු නිකේතනය පිහිටා ඇති ප්‍රදේශය)

ඔලුවිල් වරායේ දියකඩනයක් සෑදීම 2009 දී ආරම්භ කරන ලද දින සිට උතුරු පෙදෙසේ ඛාදනය සිදුවන ලදි. ඔලුවිල් වරාය ව්‍යාපෘතියේ සැලසුම්කරු වන ලංකා හයිඩ්‍රෝලික් ආයතනය නිර්දේශ කළ පරිදි මුහුදු මට්ටමේ සිට මීටර (4.0) ක ගැඹුරින් යුත් කිලෝ මීටර් 2 පමණ වෙරළ ප්‍රදේශයක් ආවරණය වන පරිදි දියඹෙහි දියකඩන 3 ක් 2012 වසරේදී ඉදිකරන ලද අතර උතුරු ප්‍රදේශයේ ඛාදනය එක්තරා ප්‍රමාණයකින් අඩු වී ඇති නමුත් තවදුරටත් උතුරු ප්‍රදේශය දෙසට පැතිරෙමින් පවතී.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිවාඩු නිකේතනය පිහිටා ඇති ප්‍රදේශයට මෙමඟින් බරපතල ලෙස බලපෑමක් එල්ල වී ඇති අතර ජල ටැංකිය, රුඳවුම් බැම්, අපද්‍රව්‍ය ටැංකි, මලාපවහන පද්ධති ආදියට හානි කරමින් නිකේතනය අසලටම ඛාදනය සිදු වී ඇති බවට නිරීක්ෂණය කර ඇත. මීටර 300ක් දිග ප්‍රමාණයක ගල් අතුරා සකස් කිරීම සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුගෙන් මිල ගණන් කැඳවා ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිවාඩු නිකේතනය (දිගින් ආසන්න වශයෙන් මීටර 150) රැකගැනීම සඳහා හදිසි ක්‍රියාමාර්ගයක් ලෙස පසුගිය වසරේ ඔලුවිල් ප්‍රදීපාගාරය අවට ප්‍රදේශය සංරක්ෂණය කිරීම සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් යොදාගන්නා ලද කොන්ත්‍රාත්කරුගෙන් මිළ ගණන් කැඳවන ලදි. දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය යටතේ හදිසි සංරක්ෂණ කටයුතු සිදුකරගෙන යෑම සඳහා වරාය සහ නාවික අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාවය ලබා ගන්නා ලදි. රු.4,986,320.20ක පිරිවැයකට වැඩකටයුතු දැනටමත් අවසන් කර ඇත.

**කළයුතු වැඩ කටයුතු**

- විශාල ගල් කුට්ටි සහ කුඩා ගල් කැබලි සැපයීම.
- භූ ආරක්ෂක ආවරණය (Geo – textile) සැපයීම සහ ඇතිරීම.
